ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

தேசிய இரத்தினக்கல், ஆபரண அதிகாரசபை

NATIONAL GEM AND JEWELLERY AUTHORITY

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

2022

කර්මාන්ත අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

MINISTRY OF INDUSTRIES

දැක්ම ප්‍රකාශය

"ශ්‍රී ලංකාව මැණික් හා මැණික් එබ්බවූ ආභරණ සඳහා කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම"

මෙහෙවර ප්‍රකාශය

මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය ප්‍රවර්ධනය සහ නියාමනය තුලින් කර්මාන්තයේ විශිෂ්ඨත්වය ළඟාකර ගැනීම.

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

ව්‍යවස්ථාපිත තොරතුරු

ප්‍රධාන කාර්යාලය - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
අංක. 25, ගාලු මුවදොර
කොළඹ 03.
දුරකථන: 011-2329295/2325364/2390645-8
ෆැක්ස් : 011-2320758
වෙබ් පිටුව : **www.ngja.gov.lk**

ප්‍රාදේශීය කාර්යාල ලිපිනයන් සහ දුරකථන අංක

ප්‍රාදේශීය කාර්යාලය (කොළඹ) - ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
අංක25,ගාලු මුවදොර
කොළඹ 03.
දුරකථන: 011-2325364, 2329295, 2390645, 2390651
ඊ මේල් : **ngjacolr@gov.lk**

ප්‍රාදේශීය කාර්යාලය (රත්නපුර) ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
රත්නපුර.
දුරකථන : 0452223591, 0452222159, 0452223592
ඊ මේල් :**srmratnapura@gov.lk**

ප්‍රාදේශීය කාර්යාලය (ඇහැළියගොඩ) ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ප්‍රාදේශීය කාර්යාලය ඇහැලියගොඩ
දුරකථන: 0362258170
ඊ මේල් :**ngjaehe@gov.lk**

ප්‍රාදේශීය කාර්යාලය (නාඋල) ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
නාඋල
දුරකථන: 0662246094
ඊ මේල් : **ngjanaula@gov.lk**

ප්‍රාදේශීය කාර්යාලය (මොණරාගල) ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
1/17, කච්චේරිය පාර, මොනරාගල
දුරකථන: 0552276124
ඊ මේල් :**ngjamonr@gov.lk**

ප්‍රාදේශීය කාර්යාලය (මාතර) ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
අංක : 391, පඹුරණ, මාතර
දුරකථන: 0412223330
ඊ මේල් :**ngjamatara@gov.lk**

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය
2022 වර්ෂය

නම		සිට	දක්වා
1. විරාජ් ද සිල්වා මහතා සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි	2022.10.14	මේ දක්වා
2. වයි.කේ.ටී.පී. වීරසිංහ මහතා හිටපු සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි	2020.11.30	2022.10.13
3. ඩී.සී.ඩබ්.හපුගොඩ මෙය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශය	සාමාජික	2022.03.01	මේ දක්වා
4. සුරේෂ් ද මෙල් මහතා, සභාපති, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය	සාමාජික	2021.01.20	මේ දක්වා
5. ඒ.පී.කේ.විජේසේකර මහතා සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව	සාමාජික	2021.09.29	මේ දක්වා
6. ඒ. කේ.එල් විජේනායක මහතා අතිරේක ලේකම්, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	සාමාජික	2022.01.31	මේ දක්වා
7. ඒ.එම්.රත්නායක මහතා – සභාපති, මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය	සාමාජික	2022.06.28	මේ දක්වා
8. පී. බී.එස්.සී. නෝනිස් මහතා, අධ්‍යක්ෂ ජනරාල් – ශ්‍රී ලංකා රේගුව	සාමාජික	2022.08.23	මේ දක්වා
9. ආචාර්ය ජී. චන්ද්‍රසේන මහතා	සාමාජික	2022.10.14	මේ දක්වා
10. බී.ඒ.එම්.රංජිත් බණ්ඩාර මහතා	සාමාජික	2022.10.14	මේ දක්වා
11. ආර්.ඩබ්ලිව්.එඩ්වින් රාජපක්ෂ මහතා	සාමාජික	2022.10.14	මේ දක්වා
12. සුමතිපාල ලියනාරච්චි මහතා	සාමාජික	2022.10.14	මේ දක්වා
13. ගුණපාල වික්‍රමගේ මහතා	සාමාජික	2022.07.25	මේ දක්වා
14. ඒ.කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා - අධ්‍යක්ෂ, මුදල් අමාත්‍යාංශය	සාමාජික	2020.01.23	2022.03.04
15. ඩබ්. ඒ. පී. සුමිත් කුමාර මහතා	සාමාජික	2020.01.01	2022.1020
16. හේමප්‍රිය මල්ලිකාරච්චි මහතා	සාමාජික	2020.01.01	2022.10.19
17. අසංක විජේසුන්දර මහතා	සාමාජික	2020.02.26	2022.10.18
18. එරංග බස්නායක මහතා	සාමාජික	2020.01.01	2022.10.17
19. ආර්.එම්. මොහාන් ජේ. රත්නායක මහතා	සාමාජික	2020.09.25	2022.04.29

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය - 2022

	නම	අධ්‍යාපන සුදුසුකම	තනතුරු නාමය
1.	**විරාජ් ද සිල්වා මහතා - සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි**	B.A. Hon (Delhi) ශාස්ත්‍රවේදි ගෞරව **(දිල්ලි)**	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී
2.	**පී.යූ.කේ.තේනුවර මහතා**	MPM, B.Com (sp) HNDA, MAAT	අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන)
3.	**ටී.ඩී. කුලනන්ද මහතා**	**විද්‍යාවේදි (රාජ්‍ය පරිපාලන)**	අධ්‍යක්ෂ (ක්‍රියාත්මක හා ප්‍රාදේශීය සංවර්ධන)
4.	**ඒ.එන්.බී.පෙරේරා මහත්මිය**	FCA, FMAAT	අධ්‍යක්ෂ (මූල්‍ය)
5.	**පී.යූ.කේ.තේනුවර මහතා**	MPM, B.Com (sp) HNDA, MAAT	අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)
6.	**ජී.ඩබ්.අමරසිරි මහතා**	B.Sc. Eng (Mining) IESL (AM)	අධ්‍යක්ෂ (ඉඩම්, කැණීම් හා පරිසර)

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ 2022 වසර සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ පාලන වාර්තාව

01. 2022 වසර ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 28 වන වසර සනිටුහන් කරයි. සමාලෝචිත වර්ෂය තුල එහි කාර්යභාරය කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය සහ රත්නපුරය, ඇහැලියගොඩ, මාතර, නාඋල සහ මොනරාගල ප්‍රාදේශීය කාර්යාල මෙන්ම කටුනායක මැණික් අපනයන මධ්‍යස්ථානය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති මැණික් හා ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානය මගින් මෙහෙයවන ලදී.

02. <u>අධිකාරියේ කර්තව්‍යයන්</u>

(අ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම;

(ආ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යෝජනා ක්‍රම ආරම්භ කර ක්‍රියාත්මක කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුලත හෝ ඉන් පිටත හෝ මැණික් හා ස්වර්ණාභරණ සඳහා වූ වෙළඳපොළ පුළුල් කිරීම සහ මැණික් හා ස්වර්ණාභරණ සඳහා ලෝක වෙළඳපොලේ ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම;

(ඈ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමේ අදහසින් එම කර්මාන්තවලට අදාල සෑම අංශයකම සේවක පිරිස්වලට කාර්මික පුහුණුව, විශේෂයෙන් තාපකරණය (heat treatment) සහ මැණික් කැපීම පිළිබඳව පුහුණුව ප්‍රවර්ධනය කිරීම සහ ඊට අනුග්‍රහය දැක්වීම;

(ඉ) අනාගත ගැණුම්කරුවන් තුල මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීමට අවශ්‍ය වියහැකි පියවරයන් ගැනීම;

(ඊ) නීති විරෝධි මැණික් ගැරීම සහ නීති විරෝධි ලෙස මැණික් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම වැලැක්වීම;

(උ) පතල් කැණීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම් යම් ආරක්ෂා කිරීමක් හේතුවෙන් හෝ අන්‍යාකාරයකින් රජය වෙත රැඳී ඇති අවස්ථාවල රජයේ ඉඩම්වල හෝ ඒ මත හෝ රජය විසින් හෝ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් බැහැර කරන ලද ඉඩම්වල හෝ ඒ මත මැණික් පතල් කැණීමේ අයිතිවාසිකම් අන්සතු කරදීම පිළිබඳව වගකිවයුතු එකම බලධරයා වශයෙන් ක්‍රියා කිරීම;

(ඌ) මැණික් හා ස්වර්ණාභරණ අලෙවි කිරීමට අවශ්‍ය කාර්මික සහ වෙනත් උපදෙස් සහ යටිතල පහසුකම් සැපයීම;

(එ) යම් උපලේඛන ගත ලිඛිත නීතියක්

i එය මැණික් හෝ මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් අදාල වනතාක් දුරට,

හෝ

ii මේ පනත යටතේ අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට සහ ඉටුකිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනතාක් දුරට එම නීතියේ කාර්යය පරිපාලනය කිරීම;

(ඒ) මැණික් සහතික කිරීම සඳහා සහ වටිනා ලෝහ වර්ග පරීක්ෂා කිරීම සඳහා කාර්යාල පිහිටුවීම:

(ඔ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ස්වර්ණාභරණ නිෂ්පාදිතයකුගේ ඉල්ලීම පිට, නියමිත ආකාරයකට විශේෂ ලකුණකින් මුද්‍රා තබන බවට වග බලා ගැනීම;

(ඕ) ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා මැණික් කර්මාන්තය, ස්වර්ණාභරණ කර්මාන්තය සහ රජයේ දෙපාර්තමේන්තු අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැගුම හා එම සම්බන්ධීකරණ ක්‍රියාදාමයන් තවදුරටත් වර්ධනය කිරීමේ අතරමැදියා වශයෙන් කටයුතු කිරීම;

(ක) මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ සේවා නියුක්තයන්ගේ සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සහ විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත සහ ශරීරාංග අනතුරුවලින් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවරයන් ගැනීම සහ ඒවා විධිමත් කිරීම සහ පාලනය කිරීම;

03. මූල්‍යය

3.1 ද්‍රවශීලතාවය :

වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ රුපියල් මිලියන 84.908 ක් වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 122.833 ක් විය. කල්පිරීමේ ආයෝජන (භාණ්ඩාගාර බිල්පත්) වල වසර ආරම්භයේදි රුපියල් මිලියන 1198.625 ක් වූ අතර එය වසර අවසානයේදී රුපියල් මිලියන 1647.583ක් විය.

වර්ෂය ආරම්භයේදී අනිකුත් මුල්‍ය වත්කම් වටිනාකම රුපියල් මිලියන 880.82 ක් වූ අතර වසර අවසානයේ දී එය රුපියල් මිලියන 934.275 ක් විය.

3.2 ලාභදායකත්වය:

	2017 රු.මිලි.	2018 රු.මිලි.	2019 රු.මිලි.	2020 රු.මිලි.	2021 රු.මිලි.	2022 රු.මිලි.
මුළු අදායම	665.818	588.609	604.581	427.8	676.6	968.6
මුළු වියදම	536.971	442.051	417.146	393.7	434.6	542.8
ලාභය (බදු වලට පෙර)	**128.847**	**146.558**	**187.435**	**34.1**	**242**	**425.8**

04. මානව සම්පත්:

2022 වසර අවසානයේ දී අධිකාරියෙහි කාර්යය මණ්ඩලය වෘත්තිකයන් ද ඇතුළුව 240 ක් විය. අඛණ්ඩ වෘත්තීයමය සංවර්ධනය වසර පුරාම සිදුකරන ලදී. කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා වර්ෂය තුල රුපියල් 2,424,603/- ක පිරිවැයක් දරා තිබුණි.

05. බලපත්‍ර නිකුත් කිරීම :

මැණික් කර්මාන්තය සඳහා අධිකාරියෙහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පසුගිය වසර පහක සංඛ්‍යා සමග සසඳා පහත දැක්වේ.

	2016	2017	2018	2019	2020	2021	2022
මැණික් ගැරීමේ බලපත්‍ර	5240	4817	5532	5,203	4,665	4,434	5,322
මැණික් වෙළඳ බලපත්‍ර	6102	5328	4795	5,449	3,481	3,628	7,193
මැණික් කැපීමේ බලපත්‍ර	243	225	211	203	146	120	192
මැණික් වෙන්දේසි බලපත්‍ර	491	461	415	684	388	444	729
බලපත්‍ර එකතුව	**12,076**	**10,831**	**10,953**	**11,539**	**8,680**	**8,626**	**13,436**

06. **අනවසර මැණික් ගැරීම් සහ පාරිසරික හානි පාලනය** :

අනවසර මැණික් ගැරීම් සහ ඒ තුලින් සිදුවන පාරිසරික විනාශයන් මැඩපැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂයතුලදී අධිකාරිය වැටලීම් ගණනාවක් සිදුකරන ලදී. සමථ ගාස්තු තුලින් රුපියල් මිලියන 15.804 ක ආදායමක් උපයා ගන්නා ලදී.

07. **විශේෂ මැණික් ගැරීමේ ව්‍යාපෘති :**

අධිකාරිය විසින් වර්ෂය තුලදී හැරණියාවක, මවුන්ට්ජින් සහ නම්මුනියාවත්ත මැණික් ගැරීමේ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද අතර මැණික් අලෙවියෙන් රුපියල් මිලියන 54.667 ක අදායමක් වර්ෂය තුළදී උපයා ගන්නා ලදී.

08. **2022 අපනයන ප්‍රවර්ධන සහ ප්‍රචාරක කාර්යයන්:**

1. රටට ඇතුළුවන විදේශිකයින්ට වීසා නිර්දේශ නිකුත් කිරීම.
2. වෙනත් රටවල මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදී සිටින ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා වීසා පහසුකම් ලබා ගැනීමට උපකාර කිරීම.
3. ඇෙමරිකන් ඩොලර් 50,000 දක්වා වටිනා මැණික් මිලදී ගැනීමට විදේශ විනිමය සඳහා නිර්දේශ සැපයීම.
4. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල අතර ප්‍රවර්ධන අත් පත්‍රිකා සහ පත්‍රිකා බෙදා හැරීම.
5. මැණික් නිපදවන රටවල් පිළිබඳව දේශීය පතල් කැණීම් ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම. (ව්‍යාපාරික කණ්ඩායම් සංවිධානය කිරීම)
6. ඇහැළියගොඩ NGJA ගොඩනැගිල්ලේ මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳ ගැලරිය (වෙළඳසැල් ගණන 13 ක් ඇතුළුව) ස්ථාපිත කර මැණික් සහ ස්වර්ණාභරණ වෙළෙඳුන් සඳහා වෙළඳසැල් භාර දෙන ලදී.
7. ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන වීඩියෝ සකස් කරන ලද අතර (ශ්‍රී ලංකාවේ මැණික්, ස්වර්ණාභරණ ශිල්පීය, NGJA මැණික් පරීක්ෂණ රසායනාගාරය, NGJA තක්සේරු කාර්යාලය සහ ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ හුවමාරුව) සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ආගමන ප්‍රදේශවල ප්‍රචාරණය කරන ලදී.
8. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ස්වර්ණාභරණ මෝස්තර ප්‍රවර්ධනය කිරීම සඳහා අත්පොතක් (Hand Book) සකස් කිරීම.
   - ස්වර්ණාභරණ නිර්මාණ එකතු කිරීම සඳහා ප්‍රචාරණ කටයුතු සිදු කර ඇත.
   - කමිටුව හරහා ස්වර්ණාභරණ නිර්මාණ තෝරාගන්නා ලදි.
   - තෝරාගත් නිර්මාණ සංවර්ධනය කිරීම සඳහා නිර්මාණකරුවන් වෙත යොමු කරන ලදි.
   - කමිටුව හරහා සංවර්ධිත නිර්මාණ ඇගයීම සිදු කරන ලදි.
9. රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, රුසියානු ස්වර්ණාභරණ වෙළඳාම සහ මැණික් වෙළෙඳ ප්‍රජාව සහ ශ්‍රී ලංකාවේ වෙළෙන්දන් සමඟ zoom තාක්ෂණය ඔස්සේ රැස්වීමක් පැවැත්වීම.
10. විභව මැණික් සහ ස්වර්ණාභරණ ගැනුම්කරුවන් සහ ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන් අතර මාර්ග ගත B2B රැස්වීමක් පැවැත්වීමට පහසුකම් සලසා ඇත.
11. ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනවලදී ශ්‍රී ලංකා මණ්ඩප සංවිධානය කිරීම.
    - ඩුබායි World Expo 2020 - 2021 දෙසැම්බර් 06 සිට 2022 ජනවාරි 09 දක්වා
12. ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා පහසුකම් සැලසීම.
    - ශ්‍රී ලංකාවේ COVID 19 තත්ත්වය හේතුවෙන් 2022 දී දේශීය ප්‍රදර්ශන සංවිධානය කර නොමැත.

13. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වැනි රාජ්‍ය ආයතන විසින් සංවිධානය කරනු ලබන දේශීය ප්‍රදර්ශන සඳහා මැණික් හා ස්වර්ණාභරණ අංශයේ සහභාගීත්වය සංවිධානය කිරීම.

14. NGJA වෙබ් අඩවිය හරහා මාර්ගගත වෙළඳාම කළමනාකරණය කිරීම.

15. මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සේවය කරන විදේශිකයන්ට වීසා නිර්දේශ ලිපි නිකුත් කිරීම. (නිකුත් කරන ලද වීසා නිර්දේශ ගණන)

16. අධිකාරියේ වෙබ් අඩවිය හරහා මාර්ගගත අපනයන සඳහා අවස්ථා හඳුන්වා දීම.

17. ස්වර්ණාභරණ ශිල්පීන්ට නිෂ්පාදන මෙවලම් බෙදා හැරීම.

18. මැණික් හා ස්වර්ණාභරණ අපනයන ක්‍රියාවලියට අදාළව වැඩමුළු පැවැත්වීම.

19. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා "සාම්ප්‍රදායික ස්වර්ණාභරණ ශිල්ප ගම්මාන" නම් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම.

20. ස්වර්ණාභරණ ශිල්පීන්ගේ ගැටළු හඳුනාගැනීම සඳහා ඔවුන්ගේ සංගම් සමඟ රැස්වීම් සංවිධානය කර පැවැත්වීම.

21. ස්වර්ණාභරණ සංගම්වල ලියාපදිංචි ස්වර්ණාභරණ නිෂ්පාදකයින් වෙත බෙදා හැරීම සඳහා ස්වර්ණාභරණ නිෂ්පාදන මෙවලම් මිලදී ගැනීම.

22. විදේශ නියෝජිතයන් වෙත නියෝජිත කණ්ඩායම් සහ කුඩා මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන සංවිධානය කිරීම.

09. අනෙකුත් සංවර්ධන කටයුතු

1. ස්වර්ණාභරණ අංශයේ උන්නතිය සඳහා X-ray fluorescent spectroscopy සහ Lacer යන්ත්‍ර වැනි නව යන්ත්‍රෝපකරණ හඳුන්වා දෙන ලදී.

2. ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා නිෂ්පාදන මෙවලම් 47 ක් බෙදාහැරීම වර්ෂය තුළ සිදු කරන ලදී.

3. ස්වර්ණාභරණ නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම සහ 2022 වර්ෂය සඳහා හැඳුනුම්පත් 1,504 නිකුත් කිරීම.

4. රත්නපුර දෙමුවාවත ජාත්‍යන්තර මැණික් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින අතර 87% පමණ භෞතිකව අවසන් කර ඇත.

5. 2022 දී නිකුත් කරන ලද මැණික් පරීක්ෂණ සහතිකය ප්‍රමාණය 9,370 කි. රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ සහ සලකුණු කිරීම සම්බන්ධයෙන් සිදුකරන ලද සහතික සංඛ්‍යාව 29,364 කි.

6. පතල් කැණීමේ බලපත්‍රය නිකුත් කිරීමේ අරමුණින් ‘‘එක් නැවතුම් පද්ධතියක්’’ සංකල්පය සතුටුදායක ලෙස ක්‍රියාත්මක වේ.

7. වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10 ක් හා විගණන හා කළමණාකරණ රැස්වීම් 04 ක් පවත්වා ඇත.

8. මැණික් පතල් කැණීමේ ක්‍රියාවලිය අතරතුර සිදු වූ මරණයක් හේතුවෙන් මැණික් පතල් කම්කරු පවුල්වලට වන්දි වශයෙන් මැණික් පතල් සුබසාධන අරමුදලින් රුපියල් 750,000/= බැගින් 03 දෙනෙකු සඳහා ගෙවන ලදී. එසේම වෙනත් පතල් කැණීමේ කටයුත්තකදී පතල් කම්කරුවන් හට සුළු තුවාල සිදුවීම මත රු.590,000/= ක් ගෙවා ඇත.

10. **මැණික් හා ස්වර්ණාභරණ අපනයනය** :

පසුගිය වසර පහක සහ සමාලෝචිත 2022 වසර තුල ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ අපනයනය පිළිබඳ තත්ත්වය පහත දැක්වෙන සංඛ්‍යා මගින් නිරූපනය වේ.

	2017 **රු. මිලි.**	**2018** **රු. මිලි.**	**2019** **රු. මිලි.**	**2020** **රු. මිලි.**	**2021** **රු. මිලි.**	**2022** **රු. මිලි.**
මැණික් අපනයන	21,644	22,304	19,364	13,120	21,619	69,709
ස්වර්ණාභරණ අපනයන	2,331	2,062	2,476	1,257	2,002	4,511
ගෙවුඩ අපනයනය	33	19	10	18	27	23
දියමන්ති ප්‍රතිඅපනයනය	14,134	19,393	23,670	16,321	28,291	70,642
දියමන්ති ආභරණ අපනයනය	207	190	242	168	356	540
මුළු අපනයනය	**38,349**	**43,968**	**45,762**	**30,884**	**52,295**	**145,422**

	2017 **ඇ.ඩො. මිලි.**	**2018** **ඇ.ඩො. මිලි.**	**2019** **ඇ.ඩො. මිලි.**	**2020** **ඇ.ඩො. මිලි.**	**2021** **ඇ.ඩො. මිලි.**	**2022** **ඇ.ඩො. මිලි.**
මැණික් අපනයන	140.27	137.60	107.21	70.62	112.19	208.46
ස්වර්ණාභරණ අපනයන	15.09	12.61	13.73	6.74	9.96	13.86
ගෙවුඩ අපනයනය	0.21	0.12	0.06	0.10	0.14	0.08
දියමන්ති ප්‍රතිඅපනයනය	91.53	118.35	131.02	92.70	140.63	211.46
දියමන්ති ආභරණ අපනයනය	1.34	1.17	1.34	0.90	1.78	1.65
මුළු අපනයනය	**248.44**	**269.85**	**253.36**	**171.06**	**264.70**	**435.51**

විරාජ් ද සිල්වා
සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය **2023.02.28**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය

		2022	2021
	සටහන්	රු. ශත .	රු. ශත
අයභාරය	**28**	688,982,632.28	525,887,828
අනිකුත් ආදායම්	**29**	12,131,873.74	21,719,148
පරිපාලන වියදම්	**30**	(254,891,259.68)	(179,454,720)
සේවක වියදම්	**31**	(281,318,241.42)	(242,186,326)
ප්‍රවර්ධන වියදම්	**32**	(6,647,506.92)	(12,903,628)
මෙහෙයුම් ලාභය		**158,257,498.00**	**113,062,301**
ශුද්ධ මූල්‍ය ආදායම	**33**	**267,490,209.82**	**128,960,706**
ශුද්ධ මූල්‍ය ආදායමට පසු ලාභය		**425,747,707.82**	**242,023,008**
බදු වලට පෙර ලාභය		**425,747,707.82**	**242,023,008**
ආදායම් බදු වියදම්	**34**	(97,515,102.16)	(37,973,066)
වර්ෂය සඳහා ලාභය		**328,232,605.66**	**204,049,942**
වර්ෂය සඳහා ලාභය		328,232,605.66	204,049,942
වෙනත් විස්තීරණ ආදායම්			
අඩුකලා:		-	-
ඒකාබද්ධ අරමුදලට දායකය		(50,000,000.00)	(40,000,000.00)
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම්		**278,232,605.66**	**164,049,942**

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන්	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**3**	616,521,711.56	514,319,799
කල්බදු ඉඩම් (භාවිතයට අයිති)	**4**	9,451.00	11,815
අනිකුත් වත්කම්	**7**	765,316,000.00	371,939,331
විකිණිය හැකි මූල්‍ය වත්කම්	**8**	1,200,010.00	1,200,010
කාරක ප්‍රාග්ධන ප්‍රගතිය		232,333,278.12	118,773,637
අනෙකුත් මූල්‍ය වත්කම්		26,890,229.05	26,890,229
ජංගම නොවන වත්කම් එකතුව		1,642,270,680	1,033,134,821
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	**9**	5,627,581.14	4,092,575
ලැබිය යුතු දෑ	**10**	191,927,790.72	95,619,502
කල්පිරෙන තෙක් රඳවාගත් ආයෝජන (HTM)	**11**	1,647,583,269.46	1,198,624,995
තැන්පත් සහ අත්තිකාරම්	**12**	174,657,139.39	177,113,499
සේවක ණය සහ අත්තිකාරම්	**13**	17,894,799.97	15,077,003
අනිකුත් මූල්‍ය වත්කම්	**14**	907,385,208.00	853,929,105
මුදල් සහ මුදලට සමාන දෑ	**15**	122,833,900.74	84,908,410
මුළු ජංගම වත්කම් එකතුව		3,067,909,689.42	2,429,365,089
මුළු වත්කම්		**4,710,180,369.15**	**3,462,499,910**
ස්කන්ධ(හිමිකම්) සහ බැරකම්			
ස්කන්ධ			
භාණ්ඩාගාරෙය් ප්‍රාග්ධනය දායකය	**16**	30,000,000.00	30,000,000
මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල	**17**	34,807,024.09	34,154,874
ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල	**18**	90,698,473.03	82,536,818
මැණික් ත්‍යාග අරමුදල	**19**	45,226,589.61	46,594,806
මැණික් ප්‍රත්‍යාගණන සංචිත	**20**	748,548,000.00	355,074,648
ප්‍රත්‍යාගණන සංචිතය	**21**	180,825,107.39	52,945,424
රඳවා ගත් ඉපයුම්		1,430,372,598.66	1,150,277,528
ස්කන්ධ එකතුව		2,560,477,792.78	1,751,584,098
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැදියාව	**22**	36,338,770.73	45,753,331
විලම්භිත බදු බැදියාව	**6**	26,597,340.28	24,368,131
කල් බදු ගෙවීමේ බැඳියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද ඉක්මවන	**23.1**	1,742.75	2,742
ජංගම් නොවන බැරකම් එකතුව		62,937,853.76	70,124,203
ජංගම බැරකම්			
කල් බදු ගෙවීමේ බැඳියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද නොඉක්මවන	**23.1**	1,668.00	1,669
ගෙවිය යුතු දෑ	**24**	286,151,680.94	213,550,981
මැණික් ගැරීමේ තැන්පතු		993,253,918.33	840,553,983.32
තැන්පත් සහ ලැබූ අත්තිකාරම්	**25**	132,880,824.63	115,846,060
ව්‍යවස්ථාපිත ගෙවීම්	**26**	622,002,115.40	392,510,500
වෙන්කිරීම් සහ උපචිත වියදම්	**27**	52,474,515.31	78,328,415
ජංගම බැරකම් එකතුව		2,806,764,722.61	1,640,791,608
ස්කන්ධ සහ බැරකම් එකතුව		**4,710,180,369.15**	**3,462,499,910**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඇති බවට අධ්‍යක්ෂක මූල්‍ය සහතික කරයි.

.....

අධ්‍යක්ෂ මූල්‍ය

පිටු 15-26 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 28 - 43 පිටුවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 පෙබරවාරි 27 වැනි දින අනුමත කරන ලදී.

....

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි **අධ්‍යක්ෂ**
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු. ශත	2021 රු. ශත
බදු වලට පෙර ලාභය	**425,747,708**	**242,023,008**
ගැලපීම්		
ක්ෂයවීම්	49,003,686	34,431,460
විශ්‍රාම පාරිතෝෂික බැඳීම් සඳහා වෙන්කිරීම්	13,632	960,314
කම්කරු වන්දි සඳහා ප්‍රතිපාදන	7,743,886	-
ලාභාංශ	(600,000)	-
පොලී ආදායම්	(267,548,442)	(128,999,414)
කල්බදු ගෙවීම් බැඳීම්වල දී ඇතිවූ මුල්‍ය පිරිවැය	58,232	38,708
භාවිතයට අයිති ඉඩම් වල ක්‍රමක්ෂය	2,364	2,364
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය	**214,421,066**	**148,456,440**
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්		
තොග	(1,535,007)	(1,522,805)
ලැබිය යුතු දෑ	19,257,829	(32,130,057)
තැන්පතු සහ අත්තිකාරම්	2,456,360	(13,632,200)
සේවක ණය සහ අත්තිකාරම්	(2,817,797)	2,865,876
ගෙවිය යුතු දෑ	72,600,700	13,392,181
මැණික් ගැරීමේ තැන්පතු	154,557,541	132,744,612
තැන්පතු සහ අත්තිකාරම් ලැබීම්	17,034,765	(16,619,859)
වෙන් කිරීම් සහ උපචිත වියදම්	(25,853,899)	5,784,423
මෙහෙයුම් වලින් ජනිත මුදල්	**450,121,558**	**239,338,611**
පාරිතෝෂික ගෙවීම්	(9,630,080)	(3,655,248)
ගෙවූ බදු	(38,588,746)	(16,480,089)
මෙහෙයුම් වලින් ජනිත ශුද්ධ මුදල්	**401,902,732**	**219,203,274**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිතවූ මුදල් ප්‍රවාහය		
දේපල,යන්ත්‍ර පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම	(21,564,451)	(64,866,955)
ලාභාංශ ලැබීම්	300,000	-
භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන	(448,958,275)	(185,000,000)
මුල්‍ය වත්කම් වල ශුද්ධ ආයෝජනයන්	(53,456,103)	(38,006,353)
පොලී ලැබීම්	152,282,324	93,872,073
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත (භාවිතා කරන ලද) ශුද්ධ මුදල්	**(371,396,505)**	**(194,001,235)**
මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහ		
මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල් උපයෝජනය	652,150	2,415,000
කල්බදු සඳහා වූ වගකීම් සමථය	(26,325)	(26,325)
ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලට දායකය	8,161,655	1,360,940
මැණික් ත්‍යාග අරමුදලට දායකය	(1,368,217)	1,847,248
මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් (භාවිත)	**7,419,263**	**5,596,863**
මුදල් සහ මුදල් සමානයන් ශුද්ධ වෙනස්වීම	**37,925,491**	**30,798,902**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදලට සමානයන්	**84,908,410**	**54,109,508**
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමානයන් **(සටහන් 15)**	**122,833,901**	**84,908,410**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සටහන්

1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

1.1 පිළියෙල කිරීමේ පදනම

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි (“අධිකාරිය”) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව පිළියෙල කර ඇත. මූල්‍ය වත්කම් ඒවායේ ඓතිහාසික පිරිවැය, ඒවායේ විකුණුම් මත ලබා ගත හැකි සත්‍ය වටිනාකමට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. සමහර ගැටළු සහගත ගිණුම් ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන්වල (SLFRSs) නියම කර ඇති කරුණුවලට එකඟව මූල්‍ය ප්‍රකාශන පිළියෙල ෙකරේ. ගිණුම්කරණ ප්‍රමිත අදාල කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමනාකාරිත්වය සිය විනිශ්චය ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ විනිශ්චයන් හෝ සංකීර්ණත්වය සම්බන්ධ ක්ෂේත්‍ර, හෝ මූල්‍ය ප්‍රකාශන සඳහා වැදගත් වන උපකල්පන සහ ඇස්තමේන්තු ක්ෂේත්‍ර අනාවරණය කෙරේ.

1.2 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්

අනිකුත් විදියකින් දක්වා නොමැති නම් පහත සඳහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට පරිවර්තනය කිරීම ආරම්භක දිනයට පැවති මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කරන ලද කාල පරිච්ඡේදවලට අදාලව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන වල ස්ථිරව යොදාගෙන ඇත.

මෙම වර්ෂයේදී මනාලෙස ඉදිරිපත් කිරීම සහ සැසඳීමට හැකිවන පරිදි අවශ්‍ය අවස්ථා වලදී පසුගිය වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

1.3 විදේශීය මුදල් පරිවර්තනය කිරීම

1.3.1 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය සහ ක්‍රියාකාරීත්වය

මූල්‍ය ප්‍රකාශයන්හී අඩංගු ගනුදෙනු සහ ශේෂයන් ආයතනය ක්‍රියාත්මක වනු ලබන මූලික ආර්ථික පරිසරයේදී භාවිතා කරනු ලබන මුදල් මත ගණනය කර ඇත. අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් (LKR) මගින් ඉදිරිපත් කර ඇත.

1.3.2 ගනුදෙනු සහ ශේෂයන්

විදේශීය මුදල් ගනුදෙනු එකී ගනුදෙනුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ මුදල් හුවමාරු අනුපාතයන් භාවිතා කරමින් ක්‍රියාකාරීත්වයේ පවතින මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ. එකී ගනුදෙනු පියවීමේදී ඇතිවන විදේශ මුදල් හුවමාරු ලාභය හෝ අලාභය සහ වර්ෂය අවසානයේ පරිවර්තනයන් එදිනට පවතින විදේශ මුදල් හුවමාරු වටිනාකම මත මූල්‍ය වත්කම් සහ විදේශ මුදල් මත ඇතිවන බැඳීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හි හඳුනා ගැනේ.

ක්‍රමක්ෂය පිරිවැය වෙනස්වීම් වලට අදාල මුදල් පරිවර්තිත වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශන වලදී හඳුනා ගැනේ.

1.3.3 දේපල, පිරියත හා උපකරණ

කළමනාකාරීත්වය අදහස් කරන පරිදී වත්කම් යම් ස්ථානයක පිහිටුවීමට හෝ ක්‍රියාකාරීත්වයට ගෙන ඒමට දරනු ලබන සෘජුවම ආරෝපිත කල හැකි ඕනෑම පිරිවැයක් දේපල, පිරියත හා උපකරණවල වටිනාකමට ඇතුලත්ව හඳුනාගැනේ.

ප්‍රත්‍යාගණන වටිනාකමට පිළියෙල කර ඇත. ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනයේදී පැවති සාධාරණ වටිනාකමට පුළුල් ලෙස සැසඳිය හැකි බැවින් අධිකාරිය විසින් නැවත ප්‍රත්‍යාගණන ලද දිනයේදී සලකා බලන ලද පිරිවැය ලෙස නැවත තක්සේරු කළ මුදල තෝරාගෙන ඇත. දේපළ, පිරියත හා උපකරණ පිරිවැය සමුච්චිත ක්ෂයීම් සහ හානි කරන පාඩු අඩුකිරීමෙන් පසුව සටහන් කරනු ලැබේ. 1998 වර්ෂයෙන් පසුව අත්පත් කර ගන්නාලද දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයීම් සහ හානිකරන පාඩු අඩු කිරීමෙන් පසුව ලෙස ගණනය කරනු ලැබේ.

වත්කමක් මිලදී ගැනීමෙන් පසුව දරනු ලබන පිරිවැය එම අයිතමය මගින් අධිකාරියට ගෙනදෙන අනාගත ආර්ථික වාසි සමග ඒකාබද්ධව විශ්වාසයකින් ගණනය කල හැකි නම් එයද වත්කමෙහි වටිනාකම ලෙස හඳුනාගනු ලබන අතර, අනිකුත් සියළුම අලුත්වැඩියා සහ නඩත්තු සඳහා දරනු ලබන ගාස්තු එකී වියදම් දරනු ලබන කාලපරිච්චේදයට අදාල විස්තීරණ ආදායම් ප්‍රකාශනවල දක්වනු ලැබේ.

සමස්ත මෝටර් රථ වර්ගය වසර තුළ නැවත ඇගයීමට ලක් කරන ලද අතර සමාලෝචනයට භාජනය වන මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.
කොළඹ 03, අංක 25, ගාලු මුවදොර ටෙරස් හි පිහිටි ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට ආසන්න ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම හේතුවෙන් ඉහත ප්‍රධාන කාර්යාල පරිශ්‍රයට හානි සිදුවී ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශය මත කාර්යාල කටයුතු වෙනත් ස්ථානයකට ගෙන යන ලදී. පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මහේස්ත්‍රාත් අධිකරණයේ අලාභ ඉල්ලා නඩුවක් ගොනු කරන ලදී.

හානිය තක්සේරු කිරීම සඳහා විශේෂඥ සේවා ලබා ගැනීම මොරටුව විශ්වවිද්‍යාලයට පවරා ඇති අතර වාර්තාව ලැබීමෙන් පසු ගොඩනැගිල්ලේ ධාරණ වටිනාකම සකසනු ලැබේ.
ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර අනෙකුත් වත්කම් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ලබන අතර පහත සඳහන් අයුරු වත්කමෙහි ඇස්තමේන්තුගත ජීව ආයුකාලය මත එහි ක්ෂයවීම් බෙදාහරිනු ලැබේ.

අයිතම වර්ගය		අනුපාත
ගොඩනැගිලි	වසර 30-50	2% - 3.33%
බෙදා වෙන්කිරීම්	වසර 3	33.33 %
පර්යේෂණාගාර හා ස්වර්ණාභරණ පරීක්ෂණ උපකරණ	වසර 10	10%
ලී බඩු සහ කාර්යාල උපකරණ	වසර 10	10%
මෝටර් වාහන	වසර 4	25%
පරිගණක උපකරණ	වසර 5	20%
අනිකුත් වත්කම්	වසර 10	10%

වත්කමෙහි ඇස්තමේන්තුගත වටිනාකමට වඩා ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම වැඩිවන්නේ නම්, වත්කමෙහි ඉදිරියට ගෙන එන වටිනාකම පියවාගත හැකි වටිනාකමට ලියා හරිනු ලැබේ.

1.3.4. අස්පෘශ්‍ය වත්කම්

පරිගණක වැඩසටහන් හා පරිගණක පද්ධති අත්පත්කර ගැනීමට හා ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා දරනු ලබන පදනම මත පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති ප්‍රාග්ධනිත කරනු ලැබේ. මිලදී ගත් අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදී ගැනීමට දරන ලද වියදමෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි වූ වටිනාකම අඩුකිරීමෙන් පසු දක්වනු ලැබේ. මෙම පිරිවැය පහත සඳහන් අයුරු ඇස්තමේන්තු ගත ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

පරිගණක පද්ධති	වර්ෂ 5	20%

පරිගණක පද්ධති නඩත්තු සඳහා දරනු ලබන පිරිවැය වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

1.3.5. කල් බදු ඉඩම්

බදු යටතේ පවතින ඉඩම මුලින් මනිනු ලබන්නේ බදු ගෙවීම් වටිනාකම වර්ධනය වන ණය අනුපාතයන් යටතේ වට්ටම්කර එයට ආරම්භක මූලික පිරිවැය හා ඉන් පසුව දරන්නට සිදුවන පිරිවැය එකතුකර වර්තමාන වටිනාකම සමාන වන පරිදි ගණනය කරනු ලබන අතර කල්බදු ඉඩම් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. කල්බදු ඉඩම් වල වටිනාකම කල් බදු කාලසීමාව තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

කල් බදු ඉඩම්	වර්ෂ 30	3.33%

1.3.6. මූල්‍ය නොවන වත්කම්වල හානිකරන පාඩු

සෑම වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය විසින් දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල අගය හානි වීමක් පෙන්නුම් කෙරේද යන්න තීරණය පිළිබඳ විමසා බැලීමට එම වත්කම්වල අගය සමාලෝචනය කරයි. එවැනි ලක්ෂණයක් පෙන්නුම් කෙරේ නම්, එම වත්කම් මගින් ආවරණය කරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කර හානි පාඩු ප්‍රමාණය තීරණය කෙරේ.

අයකරගත හැකි මුදල යනු විකිණීමට සහ භාවිතයේ ඇති වටිනාකමට වඩා වැඩි සාධාරණ වටිනාකමකි. භාවිතා කිරීමේ අගය ඇස්තමේන්තු කිරීමේදී, අනාගත අස්තමේන්තුගත මුදල් ප්‍රවාහ වර්තමාන මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකම අනාගත බදු වට්ටම් අනුපාතයෙන් ගණනය කරන අතර එම මුදල්වල වර්තමාන තක්සේරු අගය හා විශේෂ අවදානම් තක්සේරු කරනු ලැබුවද එය අනාගත මුදල් ප්‍රවාහයට ගැලපීම් නොකෙරේ.
වත්කමෙහි දරනු ලබන වටිනාකම ආවරණය කරගත හැකි ඇස්තමේන්තු වටිනාකමට අඩුනම්, ධාරණ වටිනාකම ආවරණය කරගත හැකි වටිනාකම දක්වා වත්කමෙහි වටිනාකම අඩු කරනු ලැබේ. හානි පාඩු විස්තීර්ණ මුදල් ප්‍රකාශයන්හී දී හඳුනාගනු ලැබේ.

1.4. මූල්‍ය වත්කම්

1.4.1. වර්ගීකරණය

(අ) අධිකාරිය එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මූලික හඳුනාගැනීමේදී තීරණය කරන අතර එහි මූල්‍ය වත්කම් පහත පරිදි වර්ග කරයි:

i. ණය හා ලැබිය යුතු දෑ
ii. විකිණීමට හැකි දෑ (AFS)
iii. කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන (HTM)

i. ණය හා ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රීය වෙළඳපොලක සඳහන් කර නොමැති ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය ඉක්මවා මාස 12 ට වැඩි කාලයකින් කල් ඉකුත් වන දෑ හැර අනිකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම්වල ඇතුලත්ව ඇත. වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ අධිකාරියෙහි පැවති වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය සුරැකුම් පත් නැවත මිලදී ගැනීම්, තැන්පතු, සේවක ණය හා මුදල් සහ මුදල් සමානදෑ වලින් ණය හා ලැබිය යුතු දෑ සමන්විත වේ.

ii. විකුණාගත හැකි දෑ (AFS)

මෙකී වර්ගයට නියම කරන ලද හෝ වෙනත් කිසිදු වර්ගයකට වර්ගීකරණය නොකරන ලද නමුත් පැවත එන මුල්‍ය වත්කම් විකිණිය හැකි ආයෝජන යටතට ගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයෙන් පසු මාස 12 ක් තුල විකිණීමට තීරණය නොකරන ලද හෝ කල් පිරෙනු ලබන ජංගම වත්කම් ගණයට නොවැටෙන දේ මෙයට ඇතුලත්වේ. විකිණිය හැකි මුල්‍ය වත්කම් දිගුකාලීන ලැයිස්තගත නොවූ ස්කන්ධ ආයෝජනවලින් සමන්විත වේ.

iii. කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන (HTM)

HTM ආයෝජන යනු ණය සහ ලැබිය යුතු දේ හැර ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීමක් සහිත ව්‍යුත්පන්න නොවන මුල්‍ය වත්කම් වේ. අධිකාරියට ධනාත්මක චේතනාවක් සහ පරිණතවන තෙක් තබා ගැනීමට හැකියාවක් තිබේ නම්, HTM ආයෝජන ලෙස වර්ග කෙරේ.

ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කරනු ලබන වාර්තා කරන කාලපරිච්ඡේදය අවසන් වීමෙන් පසු මාස 12කට අඩු කාලයක් ඉක්මවී කල් පිරෙනු ලබන HTM ආයෝජන ජංගම වත්කම්වල ඇතුළත් කෙරේ. අධිකාරිය දැනට භාණ්ඩාගාර බිල්පත්වල කර ඇති ආයෝජන මේ යටතට ගැනේ.

1.4.2 හඳුනාගැනීම් සහ මූලික ගණනය කිරීම්

මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු මුදල් ලෙස වර්ගීකරණය කරන අතර අධිකාරිය විසින් ගනුදෙනුව ආරම්භ කළ දිනයේ පිළිගනු ලැබේ. අධිකාරිය මූල්‍ය ලේඛනයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශවකරුවෙකු බවට පත්වන වෙළඳ දිනයේදී අනෙකුත් මුල්‍ය වත්කම් පිළිගනු ලැබේ.

මූල්‍ය වත්කමක් මූලික ලෙස මනිනු ලබන්නේ සාධාරණ වටිනාකම මත වන අතර සාධාරණ වටිනාකමක් නොමැති වත්කම් සම්බන්ධයෙන් ලාභය හෝ අලාභය හරහා සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයෙනි.

මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත් වූ විට හෝ මාරු කර ඇති විට සහ අධිකාරිය විසින් මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ත්‍යාග සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට මූල්‍ය වත්කම් හඳුනාගනු නොලැබේ.

1.4.3 දෙවනුව ගණනය කිරීම්

i. **ණය සහ ලැබිය යුතු දෑ**

මූලික හඳුනාගැනීමෙන් පසුව ණය හා ලැබිය යුතු දෑ ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් හානි හා පාඩු සඳහා වෙන් කිරීම් අඩුකර ක්‍රමක්ෂය වියදම් මත ගණනය කෙරේ.

ii. **විකිණිය හැකි දෑ (AFS)**

මූලික හඳුනාගැනීමෙන් පසුව ලැයිස්තු ගත නොවූ ආයෝජන විකුණාගතහැකි මූල්‍ය වත්කම් ලෙස වර්ග කෙරෙන අතර එහි වර්තමාන සාධාරණ වටිනාකම නියත වශයෙන් ඇස්තමේන්තු කල නොහැකි විට පිරිවැයෙන් හානිකරන අලාභය අඩු කිරීමෙන් ගණනය කරනු ලැබේ.

ii. කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන (HTM)

කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය මත , ඵලදායි පොළී ක්‍රමය භාවිතා කරමින් වූ ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී හා හුවමාරු පිරිවැය මත වට්ටම් සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීම් සහ ගනුදෙනු පිරිවැය මත වට්ටම් හෝ වාරික සැලකිල්ලට ගනිමින් ක්ෂය පිරිවැය ගණනය කෙරේ.

1.4.4 මූල්‍ය වත්කම්වල හානි කරන පාඩු

I. **වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැය මත දැක්වීම**

මූල්‍ය වත්කම්වල වටිනාකම හානිවී තිබෙන බවට පිලිගත හැකි සාක්ෂි තිබෙනම් වාර්තා කරනු ලබන සෑම කාල පරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය විසින් තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක අගය අඩුවී තිබෙනම් එම හානිවීමෙන් සිදුවූ අඩුවීම අඩංගුව ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේ නම්ද , වත්කමක් මූලික හඳුනාගැනීමෙන් පසු සිද්ධීන් එකක් හෝ කිහිපයක ('අහිමි සිදුවීමක්') ප්‍රතිඵලයක් ලෙස එය ඇතිවී ඇත්නම් සහ එකී පාඩු අවස්ථාව හෝ අවස්ථාවන් (හෝ සිදුවීම්) අනාගත ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් සිදු කෙරෙන විට එය පිළිගත හැකි ලෙස ඇස්තමේන්තු කෙරේ.

ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ණය සහ ලැබිය යුතු දෑ සහ කල් පිරෙන ආයෝජන සඳහා, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ වටිනාකම සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම (ඇතුලත් නොවූ අනාගත බැර පාඩු හැර) අනුව අලාභය ගණනය කර එම මූල්‍ය වත්කම්වල මුල් ඵලදායි පොළී අනුපාතයට වට්ටම් කිරීමෙනි. මූල්‍ය වත්කම්වල ධාරණ වටිනාකම අඩු කරන අතර අලාභයේ ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගැනේ.

පසුකාලීන කාලපරිච්ඡේදයකදී, හානිකරන පාඩුවේ වටිනාකම අඩු වන්නේ නම්ද අඩුවීම සහ හානිකරන පාඩුව හඳුනා ගැනීමෙන් පසු සිදුවන සිදුවීමකට සම්බන්ධ නම් හඳුනාගත් හානිකරන පාඩුව ආපසු හැරවීම විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

II විකිණිය හැකි දෑ (AFS)

මූල්‍ය වත්කමකට හානි සිදුවී ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබෙනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය එය තක්සේරු කරනු ලැබේ. ලැයිස්තුගත නොකල හිමිකම් (ස්කන්ධ) ආයෝජනයන් සඳහා, ආයෝජනයන්ගේ වටිනාකම සැලකිය යුතු හෝ දිගින් දිගටම පිරිහීම පිළිබඳ සාක්ෂි ඇත්නම් වත්කම්වල අගය අඩු කරනු ලැබේ. මිල ගණන් ප්‍රකාශයට පත් නොකල ආයෝජනයන් සඳහා එවැනි සාක්ෂි තිබෙනම්, මූල්‍ය වත්කමේ ධාරණ වටිනාකම සහ වෙනත් එවැනි වත්කමක් සඳහා වර්තමාන ඉපයීම් වෙළඳපල අනුපාතය මගින් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් ලැබෙන වර්තමාන අගය අතර වෙනස ගණනය කර හානිකරන පාඩුව ගණනය කරනු ලැබේ. එවැනි හානිකරන පාඩු යථා තත්ත්වයට පත්කරනු නොලැබේ.

1.5 භාණ්ඩ තොග

තොග අගය කරනු ලබන්නේ අඩු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය අනුව ය. පිරිවැය තීරණය කරනු ලබන්නේ පෙර පිවිසි පෙරනිකුතු ක්‍රමය අනුවය. පාරිභෝගික භාණ්ඩ සහ ලිපිද්‍රව්‍ය වලින් තොග සමන්විත වේ.

1.6 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ මුලින්ම එහි සත්‍ය වටිනාකම් මත (ඉන්වොයිස් අගය) හඳුනා ගන්නා අතර, ඉන් පසුව හිඟ මුදල් කෙටි කාලයක් තුළ ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන බැවින් සත්‍ය වටිනාකම් (ඉන්වොයිස් අගය) සලකා එයින් හානි සඳහා අඩු කිරීමද සිදු කරන අතර, මුදල් වල කාලීන වටිනාකම සැලකිල්ලට නොගැනේ.

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම ආපසු ලැබිය යුතු දෑවල හානිවලට අදාල සාක්ෂි තිබෙදැයි අධිකාරිය විසින් නිරීක්ෂණය තක්සේරු කරනු ලැබේ. ලැබිය යුතු දෑවල හානිකරන පාඩුවේ අධිකාරියෙහි පසු ගිය මුදල් එකතු කිරීමේ අත්දැකීම් සහ ලැබීම් ප්‍රමාද සංඛ්‍යාව ඇතුළත් වේ. ලැබිය යුතු දෑ වල හානි සහ හානිකරන පාඩුව පිළිබඳ සාක්ෂි තිබෙනම් ලැබිය යුතු දෑ හානි පාඩු සඳහා වෙන වෙනම තක්සේරු කරනු ලැබේ.

1.7 මුදල් හා මුදල් සමානදෑ

මුදල් හා මුදල් සමානදෑ තුල අතැති මුදල්, බැංකු ඒක්ෂණ තැන්පතු, මාස තුනක් හෝ ඊට පෙර කල් පිරෙනු ලබන ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ඇතුලත් කර ඇත.

1.8 දායකත්ව ප්‍රාග්ධනය

රාජ්‍ය මැණික් සංස්ථාවේ බැර කිරීමට ඇති සහ අධිකාරියට පැවරූ මුදල ඇතුළත් මූලික ප්‍රාග්ධනයෙන් ප්‍රාග්ධනය නියෝජනය වේ.

1.9 මූල්‍ය බැරකම්

අධිකාරියෙහි මූල්‍ය බැරකම් අනිකුත් මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. අධිකාරියෙහි අනිකුත් මූල්‍ය බැරකම් වලට ගෙවිය යුතු දෑ, බලපත්‍ර සඳහා ලැබූ අත්තිකාරම්, මැණික් ගැරීමේ තැන්පතු හා අනිකුත් තැන්පත් ලැබීම් ඇතුලත් වේ. සාධාරණ වටිනාකම සහ සෘජුව ආරෝපණය කළ හැකි ඕනෑම ගනුදෙනු පිරිවැය මත අනෙකුත් මූල්‍ය බැරකම් මූලිකව හඳුනා ගැනේ.

මූලික හඳුනාගැනීමෙන් පසුව කෙටි කාලයක් තුලදී ආපසු ගෙවීමට බලාපොරොත්තුවන හිඟ මුදල්වල මූලික වටිනාකම අනුව මෙම මූල්‍ය බැරකම් ගණනය කර හඳුනා ගැනීම සිදුකෙරේ.

කල් ඉකුත්වීම, අවලංගු කිරීම, ගිවිසුම් ගත බැදීම් වලින් නිදහස් වීම වැනි අවස්ථා වලදී අධිකාරිය මූල්‍ය බැරකම් ඉවත් කෙරේ.

1.10 ප්‍රවර්තන හා විලම්භීත බදු

කාලපරිච්ඡේදය තුල දරන ලද බදු වියදම් වල ප්‍රවර්තන හා විලම්භීත බදු අඩංගු වේ. වෙනත් විස්තීරණ ආදායම්වල පිළිගත් අයිතමවලට අදාළ ප්‍රමාණයට හැර විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ බද්ද හඳුනාගෙන ඇත. මෙහිදී, බද්ද වෙනත් විස්තීර්ණ ආදායමකින් ද හඳුනා ගැනේ. වත්මන් ආදායම් බදු ගණනය කරනු ලබන්නේ අධිකාරියට ක්‍රියාත්මක වීමට සහ බදු අය කළ හැකි ආදායම් උත්පාදනය කිරීමට අදාළ වාර්තාකරණ කාල සීමාවේදී පනවන ලද බදු නීති මත පදනම්වය. බදු අධිකාරීන්ට ගෙවීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණය අනුව කළමනාකරණය සුදුසු අවස්ථාවලදී ප්‍රතිපාදන ස්ථාපිත කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් හා වගකීම්වල බදු පදනම සහ ඒවායේ ධාරණ වටිනාකම මත පැන නගින තාවකාලික වෙනස අනුව විලම්භීත බදු හඳුනාගැනේ. ගනුදෙනුව සිදුවන අවස්ථාවේ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි ලාභයක් හෝ අලාභයක් බලපාන්නේ නැති ව්‍යාපාරික සංයෝජනයක් හැර වෙනත් ගනුදෙනුවක වත්කම් හා වගකීම් සම්බන්ධ ගනුදෙනු සිදුවන අවස්ථාවලදී විලම්භීත බදු ගිණුම් ගත නොකෙරේ. කාලපරිච්ඡේදය අවසන් වන දිනයට බල පවත්වන බදු අනුපාතයන් භාවිතයෙන් විලම්භීත බදු තීරණය කරන අතර අදාළ විලම්බිත බදු වත්කම් සාක්ෂාත් කර ගත් විට හෝ විලම්භීත ආදායම් බදු වගකීම පියවූ විට විසඳා ගැනීමට අපේක්ෂා කෙරේ.

විලම්භීත බදු හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් භාවිතා කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභය ලබා ගත හැකි ප්‍රමාණයට පමණි.

අනාගත බදු වත්කම් හා වගකීම් වර්තන බදුවලට එරෙහිව හිලව් කිරීම සඳහා නීතිමය බලාත්මක අයිතියක් තිබෙනම්, බදු අධිකාරීන් විසින් ආදායම් බදු පැනවීමේදී ඒ හා සම්බන්ධ වේ නම් විලම්භීත බදු වගකීම් වර්තන බදු වගකීම් වලට එරෙහිව ලියා හැරේ.

1.11 සේවක ප්‍රතිලාභ

(අ) නිර්වචිත දායකත්ව සැලසුම

සේවය අවසන් කිරීමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ සැලැස්මක් වන අතර අධිකාරිය විසින් ස්ථීර දායකත්ව මුදලක් වෙනත් ආයතනයක තැන්පත් කිරීම නිශ්චිත දායකත්ව සැලසුමට අයත්වේ. අධිකාරිය තවදුරටත් දායකත්ව ගෙවීම සඳහා නීතිමය හෝ වෙනත් සම්බන්ධිත බැඳීම් කිසිවක් නොමැත. දායක මුදල් ගෙවිය යුතු විට ඒවා සේවක ප්‍රතිලාභ වියදම් ලෙස පිළිගැනේ.

සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයන්ගේ දළ සේවා පාරිශ්‍රමිකයන් මත 15% දායක මුදලක්ද, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා දළ සේවා පාරිශ්‍රමිකයන් මත 3% ක දායක මුදලක්ද අධිකාරිය විසින් දරනු ලැබේ.

(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම සම්බන්ධව අධිකාරියෙහි බැඳීම වන්නේ වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේදී නිර්වචිත ප්‍රතිලාභ වල පවතින වර්තමාන වටිනාකමයි. පාරිතෝෂිත සූත්‍රය භාවිතයෙන් ගණනය කරන ලද ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් නිර්වචිත ප්‍රතිලාභ වගකීම වාර්ෂිකව මනිනු ලැබේ. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම තීරණය වන්නේ වත්මන් සහ පෙර කාල සීමාව තුළ සේවකයා තම සේවා සඳහා ප්‍රතිලාභ වශයෙන් උපයා ඇති ඇස්තමේන්තුගත අනාගත ප්‍රතිලාභය වට්ටම් කිරීමෙනි.

උපකල්පනවල වෙනස්වීම් නිසා ඇතිවන ලාභ සහ අලාභ, වත්මන් සේවා පිරිවැය සහ පොලී ඒවා පැනනගින කාල සීමාව තුළ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම බාහිරව අරමුදල් සපයන්නේ නැත.

(ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වගකීම් මනිනු ලබන්නේ සේවකයින් විසින් සපයනු ලබන අදාළ සේවාවන් සඳහා ගෙවීමට අපේක්ෂා කරන වට්ටම් නොකළ මුදලිනි.

1.12 වෙන්කිරීම් සහ අසම්භාව්‍ය වගකීම්

නිශ්චිත වශයෙන් ගණනය කල හැකි හා ආර්ථික සම්පත් ඉවතට ගලායාමේ සම්භාවිතාවක් ඇති බව පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස නීතිමය අයුරින් හෝ වටහා ගතහැකි පරිදි වර්තමාන බැදීම් අධිකාරියට ඇතිවිට නීතිමය ඉල්ලීම් මත වෙන්කිරීම් හා අනිකුත් ක්‍රියාකාරි වියදම් හඳුනාගැනේ.

වාර්තාකරනු ලබන දිනය වන විට පිළිගත හැකි සාක්ෂි තිබෙනම් හා වර්තමාන බැදීම් සමග අවදානම සහ අවිනිශ්චිතාව සම්බන්ධ වී ඇතුලත්ව තිබේ නම්, වර්තමාන බැදීම් පියවීම සඳහා අවශ්‍යවන ඇස්තමේන්තුගත වියදම් අනුව වෙන්කිරීම් ගණනය කරනු ලැබේ.

සම්පත් ඉවතට යාමේ සම්භාවිතාවයක් නොමැති නම් සියළු අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

1.13 අදායම් හඳුනා ගැනීම

ලැබූ හා ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ (Consideration) සාධාරණ අගය සැලකිල්ලට ගෙන ආදායම් ගණනය කරන අතර මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීම, බලපත්‍ර ගාස්තු, නිර්යාත කොමිස් හා සේවා සැපයීම්, එකතු කල අගය මත බදු (VAT) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) වෙනුවෙන් ලැබිය යුතු ආදායම නියෝජනය කරයි. ආදායම් ප්‍රමාණය නිශ්චිත ලෙස ගණනය කල මැනිය හැකි විට සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරියට ගලා ඒමට ඉඩ ඇති විට අධිකාරිය ආදායම් හඳුනා ගනී.

අධිකාරිය විසින් සපයනු ලබන එක් එක් හඳුනාගත හැකි ප්‍රධාන සේවා වර්ගය සඳහා පහත දක්වා ඇති ආදායම් හඳුනාගැනීමේ නිර්ණායක යොදා ගැනේ.

(අ) මැණික් ගැරීමේ අයිතිය අලෙවිය (ඉඩම් වෙන්දේසි)

මැණික් ගැරීමේ අයිතිය විකිණීම යනු බලපත්‍රලාභියාට වෙන් කර ඇති ඉඩම්වල මැණික් ගැරීමේ බලපත්‍ර ලබාදීම සඳහා අය කරන ලද මිල ගණන් වේ. මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදී අදායම් හඳුනාගැනේ.

(ආ) බලපත්‍ර ගාස්තු - අලෙවිකරුවන්, මැණික් කැපීමේ, ඔප දැමීමේ බලපත්‍ර

බලපත්‍රයේ කාල සීමාව අනුව සෘජු ක්‍රමය යටතේ බලපත්‍ර ගාස්තු ආදායම් හඳුනාගැනේ.

(ඇ) බලපත්‍ර ගාස්තු - මැණික් ගැරීමේ, යන්ත්‍ර මගින් මැණික් ගැරීමේ (BACO) සහ මැණික් වෙන්දේසි බලපත්‍ර

මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදි බලපත්‍ර ගාස්තු ආදායම් හඳුනා ගැනේ.

(ඈ) මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත කොමිස් - (නිර්යාත සේවා ගාස්තු සහ කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු)

භාණ්ඩ නිර්යාත කිරීමට සුදානම් කල අවස්ථාවේදී නිර්යාත කොමිස් ආදායම් ලෙස හඳුනා ගැනේ.

(ඉ) සේවා

මැණික් ඉඩම් පරීක්ෂා කිරීම වෙනුවෙන් වූ ආදායම් ගෙවීම් ලැබෙන අවස්ථාවේදී ආදායම් ලෙස හඳුනා ගැනේ**.**

(ඊ) කුලී ආදායම්

බදු කොන්දේසි සැලකිල්ලට ගෙන උපචිත පදනම මත කුලී ආදායම හඳුනා ගැනේ.

(උ) පොළී ආදායම්

ක්‍රියාත්මක වන පොලී ක්‍රමය මත පොළී ආදායම් හඳුනාගැනේ.

(ඌ) ලාභාංශ ආදායම්

ගෙවීම් කිරීම තහවුරු කරනු ලබන අවස්ථාවේදී ලාභාංශ ආදායම් හඳුනාගැනේ.

(එ) දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු

ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු තීරණය කිරීම එම වත්කමෙහි දරනු ලබන අගය සහ විකුණා ලැබෙන මුදල සමග සැසඳීමෙන් පසුව විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හීදී සිදු කෙරේ.

1.14 වියදම්

වාර්තා කරනු ලබන කාල පරිච්ඡේයට අදාලව ලාභ ඉපයීම සඳහා ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාමට දරනු ලබන සියළු වියදම් ඇතුලත්වේ.

1.15 වාර්තා කරනු ලබන කාලයට පසු සිදුවීම්

වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයට පසු සිදුවීම් වල ප්‍රමාණාත්මක බව සලකා අවශ්‍ය පරිදී ගැළපීම් සිදුකර මුල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

1.16 බැඳීම්

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ පවතින සියළු ප්‍රමාණාත්මක බැඳීම් හඳුනාගෙන මුල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

1.17 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණයන්

මුල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී කළමණාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනා ගැනීමට සහ ඒවා ගණනය කිරීම සඳහා බොහෝ තීරණයන් මත ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදුකර ඇත.

i. මුල්‍ය ප්‍රකාශනවලට බොහෝ බලපෑම් ඇති කරනු ලබන ගිණුම් ප්‍රමිත භාවිතා කිරීමේදී පහත සඳහන් වැදගත් තීරණයන් ගනු ලැබීය.

(අ) **විලම්භීත බදු වත්කම් හඳුනාගැනීම**

වත්කම්වල අනාගත ප්‍රයෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ බදු ආදායමක් ලැබීමේ සම්බන්ධතාවයක් පවතීනම් එම වත්කම් එම ප්‍රමාණයට පමණක් විලම්භීත බදු වත්කම හඳුනා ගැනේ.

ii. වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම සහ ගණනය කිරීම් වලදී බොහෝ වැදගත් සිදුවීම් සඳහා ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

(අ) **ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය**

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ඇස්තමේන්තු කිරීමේදී එම වත්කමෙහි යෝජිත ආර්ථික භාවිතය පදනම්ව කළමනාකාරිත්වය සලකා බලනු ලැබේ. මෙම ඇස්තමේන්තු වලදී තාක්ෂණිකව අභාවයට යෑම (යල්පැන යාම) පිළිබඳ පරිගණක උපාංග හා පරිගණක මෘදුකාංග වල අවිනිශ්චිතතාවයක් පවතී.

(ආ) **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

උපකල්පනයන් ගණනාවක් භාවිතා කරමින් හා සාධක ගණනාවක් සැලකිල්ලට ගනිමින් යෝජිත ඒකක බැර පදනම මත නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම්වල වර්තමාන වටිනාකම තීරණය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම් සහ ශුද්ධ පිරිවැය උපකල්පනය කිරීමේදී යොදාගන්නා වට්ටම් අනුපාතයන් හෙළිදරව් කර ඇත. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තන වටිනාකමට මෙම උපකල්පනයන්ගේ වෙනස්වීම් බලපානු ලැබේ.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

	දායක ප්‍රාග්ධනය	මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල	ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල	මැණික් ත්‍යාග අරමුදල	අනිකුත් සංචිත	මැණික් ප්‍රත්‍යාගණන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	රදවාගත් ඉපයුම්	එකතුව
2021 ජනවාරි 01 දිනට ශේෂය	**30,000,000**	**31,739,874**	**76,067,905**	**44,747,558**	**-**	**355,074,648**	**52,945,425**	**985,905,139**	**1,576,480,549**
සාධාරණ අගයට ගැළපීම්						-			-
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	-	-	164,372,389	164,372,389
අනිකුත් විස්තීරණ ආදායම්	-	-	-	-	-	-	-	-	-
විස්තීරණ ආදායම් එකතුව									**1,740,852,938**
පසුගිය වර්ෂයට ගැළපීම්									-
වර්ෂය සඳහා දායකත්වය/ (උපයෝජනය)	-				-	-	-	-	-
අගය අඩුවීමට ගැළපීම්		2,415,000	6,468,913	1,847,248					10,731,161
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**30,000,000**	**34,154,874**	**82,536,818**	**46,594,806**	**-**	**355,074,648**	**52,945,425**	**1,150,277,528**	**1,751,584,099**
සාධාරණ අගයට ගැළපීම්	-	-	-	-	-	-	-		
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	-	-	278,232,606	278,232,606
අනිකුත් විස්තීරණ ආදායම්	-	-	-	-	-	-	-	-	-
විස්තීරණ ආදායම් එකතුව									-
පෙර වර්ෂය සඳහා ගැළ ම් **(සටහන 39)**									-
වර්ෂය තුල දායකත්වය/ (උපයෝජනය)	-				-	-	-	-	-
හානි පාඩු සඳහා ගැළපීම්	-	652,150	8,161,655	(1,568,216)	-	393,473,352	127,879,682	1,862,465	530,461,088
									-
2022දෙසැම්බර් 31 දිනට ශේෂය 2	**30,000,000**	**34,807,024**	**90,698,473**	**45,026,590**	**-**	**748,548,000**	**180,825,107**	**1,430,372,599**	**2,560,277,792**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

දේපල, පිරියත හා උපකරණ පිරිවැයට	2022 ජනවාරි 01 දිනට	එකතු කිරීම්	ප්‍රත්‍යාගණන වටිනාකම	ගැලපීම්	2022 දෙසැම්බර් 31 දිනට
නිදහස් අයිතිය ඇති					
ඉඩම්	40,374,059		-	-	40,374,059
ගොඩනැගිලි	388,278,233	6,261,907.00	-	-	394,540,140
සවිකිරීම් සහ උපකරණ	23,579,122	678,550.00	-	-	24,257,672
ලීබඩු	22,036,555.78	115,065.00	-	-	22,151,621
කාර්යාල උපකරණ	25,015,575	399,764.00	-	-	25,415,339
පරිගණක	41,869,855	8,750,665.00	-	-	50,620,520
රසායනාගාර උපකරණ	60,150,047	13,500.00	-	-	60,163,547
මැණික් කැපීමේඋපකරණ	403,475	-	-	-	403,475
ස්වර්ණාභරණ උපකරණ	148,200	-	-	-	148,200
තත්ත්ව මුද්‍රා උපකරණ	173,183,686	5,035,000.00	-	-	178,218,686
යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ	13,790,342	-	-	-	13,790,342
රථ වාහන	118,672,998	210,000.00	129,450,000	118,672,998	132,116,499
යතුරු පැදි	100,000		85,000	100,000	85,000
පාපැදි	37,334	-	-	-	37,334
පුස්තකාල පොත්	-		-	-	-
ඉඩකඩ වෙන්කිරීම්	9,620,694	-	-	-	9,620,694
ඉඩකඩ වෙන්කිරීම් ජංගම					
- රසායනාගාර	2,456,500	-	-	-	2,456,500
කල් බදු	-	-	-	-	-
ඉඩම්	159,205		-	-	159,205
	919,875,880	**21,464,451**	**129,535,000**	**118,772,998**	**952,102,334**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශනවලට සටහන්

ක්ෂයවීම්	2022 ජනවාරි 01 දිනට	වර්ෂයට අදාළ අයකිරීම්	ගැළපීම්	2022 දෙසැම්බර් 31 දිනට
නිදහස් අයිතිය ඇති				
ගොඩනැගිලි	62,358,560.67	7,866,785		70,225,345.67
සවිකිරීම් සහ උපකරණ	17,152,660.06	1,157,604	-	18,310,264
ගෘහභාණ්ඩ	13,737,709.51	1,145,182	-	14,882,892
කාර්යාල උපකරණ	19,551,253.50	1,357,668	-	20,908,922
පරිගණක	31,066,073.09	4,137,846	-	35,203,919
රසායනාගාර උපකරණ	30,040,271.48	4,877,363	-	34,917,634
මැණික් කැපීමේ - උපකරණ	403,475.00		-	403,475
ස්වර්ණාභරණ උපකරණ	148,200.00		-	148,200
තත්ත්ව මුද්‍රා උපකරණ	88,998,765.64	15,397,849	-	104,396,615
යන්ත්‍ර සහ ගෙවුඩ -උපකරණ	9,705,670.80	549,798	-	10,255,469
රථ වාහන	116,560,282.49	12,378,418	- (117,017,680)	11,921,020
යතුරු පැදි	100,000.00	7,801	(100,000)	7,801
පාපැදි	37,334.00		-	37,334
පුස්තකාල පොත්	-		-	-
ඉඩකඩ වෙන්කිරීම්	9,332,101.76	127,372	-	9,459,474
ඉඩකඩ වෙන්කිරීම් - ජංගම රසායනාගාර	2,456,500.00		-	2,456,500
	401,648,858	**49,003,686**	**(117,117,680)**	**333,534,864**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

ශුද්ධ ධාරන අගය	2022 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට	ගැලපීම්	2021 ජනවාරි 01 දිනට
නිදහස් අයිතිය ඇති				
ඉඩම්	40,374,059.00	40,374,059.00		40,374,059
ගොඩනැගිලි	324,314,794.74	325,919,672.74		325,682,152
සවිකිරීම් සහ උපකරණ	5,947,407.89	6,426,461.89		5,965,349
ගෘහභාණ්ඩ	7,268,729.27	8,298,846.27		4,833,840
කාර්යාල උපකරණ	4,506,417.29	5,464,321.29		6,937,733
පරිගණක	15,416,600.89	10,803,781.89		2,776,617
රසායනාගාර උපකරණ	25,245,912.12	30,109,775.12		33,585,262
මැණික් කැපීමේ උපකරණ	-	-		-
ස්වර්ණාභරණ උපකරණ	-	-		-
තත්ත්ව මුද්‍රා උපකරණ	73,822,070.87	84,184,919.87		61,432,012
යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ	3,534,873.19	4,084,671.19		2,593,419
රථ වාහන	117,738,978.36	2,112,715.36		3,451,881
යතුරු පැදි	77,199.00	-		-
පාපැදි	-	-		-
පුස්තකාල පොත්	-	-		-
ඉඩකඩ වෙන්කිරීම්	161,219.94	288,591.94		-
ඉඩකඩ වෙන්කිරීම් - ජංගම				
-රසායනාගාර	-	-		-
කල්බදු				
ඉඩම්	159,205.00	159,205.00		159,205
	618,567,467.56	**518,227,022**		**487,791,527**
අගය අඩුවීමට ගැලපීම්	(2,045,756)	(3,907,223)		(3,431,368)
	616,521,711.56	**514,319,799**		**484,360,159**

විගණකවරුන්ගේ නිර්දේශය පරිදි මෝටර් රථ නැවත තක්සේරු කරන ලදී. මෝටර් රථ නැවත තක්සේරු කළ මුදල රුපියල් 129,450,000.00

බෙලිදෙනිය ඉඩම - හෙක්ටයාර් 0.1095 උක්ත ඉඩම ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා විසින් 2017/07/07 දිනැති 2026/37 අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් නැවත පවරා දෙන ලදී.

4. කල්බදු ඉඩම් - ඉඩම් භාවිතය සඳහා අයිතිය

ඉඩම භාවිතා කිරීමට ඇති අයිතිය, ආරම්භයේ දී වැඩිවන ණය ගැනීම් අනුපාතය භාවිතා කරමින් වට්ටම් කරන ලද බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට සමාන මුදලකින් මනිනු ලබන අතර කල්බදු කාල සීමාව තුළ ක්‍රමක්ෂ කරනු ලැබේ.

ඉඩම් භාවිතය සඳහා ධාරණ වටිනාකම	2022	2021
ප්‍රාග්ධනිත අගය		
ජනවාරි 01 දිනට	**70,909.00**	**70,909**
දරන ලද මූලික පිරිවැය	-	-
වර්ෂයතුල ප්‍රාග්ධනිත කිරීම්	-	
දෙසැම්බර් 31 දිනට	**70,909.00**	**70,909**
ක්‍රමක්ෂය		
ජනවාරි 01 දිනට	**59,094.00**	**56,730**
වර්ෂය තුල ක්‍රමක්ෂය වීම	2,364.00	2,364
දෙසැම්බර් 31 දිනට	**61,458.00**	**59,094**
ධාරණ වටිනාකම	**9,451.00**	**11,815**

ඉඩම්වල කල්බදු අයිතිය 1997 නොවැම්බර් මස ආරම්භ වූ අතර එය අවරුදු 30 සඳහා වේ. කල්බදු කොන්දේසි අනුව 2026 නොවැම්බර් දක්වා වාර්ෂිකව ඉඩම් භාවිතය සඳහා වූ කල්බදු අයිතිය සංක්‍රාන්ති අවධියේ (2011 ජනවාරි 01) සිට ඉදිරි කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

5. අස්පෘශ්‍ය වත්කම්	2022 දෙසැම්බර් 31 දිනට	එකතු කිරීම්/(ඉවත් කිරීම්)	2021 දෙසැම්බර් 31 දිනට
5.1 පිරිවැයට			
පරිගණක මෘදුකාංග	2,677,306.12	-	2,677,306
එකතුව	**2,677,306.12**	**-**	**2,677,306**

	2022 දෙසැම්බර් 31 දිනට	වර්ෂය තුල වෙනස් වීම්	2021 දෙසැම්බර් 31 දිනට
5.2 ක්‍රමක්ෂය			
පරිගණක මෘදුකාංග	2,677,306.12	-	2,677,306
එකතුව	**2,677,306.12**	**-**	**2,677,306**

5.3 ශුද්ධ ධාරණ අගය	2022 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට
පරිගණක මෘදුකාංග	-	-

			2022	2021
6	**විලම්භීත බදුවත්කම් /(වගකීම්)**			
	ජනවාරි 01 දිනට ශේෂය		**24,368,130.77**	**24,644,383.96**
	ගැළපීම්		2,229,209.51	(276,253.19)
	දෙසැම්බර් 31 දිනට ශේෂය		**26,597,340.28**	**24,368,131**

			2022	2021
7	**අනිකුත් වත්කම්**			
	රළු මැණික් ගල් සහ සින්තටික් ගල්		96,682.58	96,682.58
	ප්‍රදර්ශන මැණික් ගල්		765,219,317.42	371,842,648.00
	මැණික් සහ මැණික් ආයතනයට අත්තිකාරම් ගෙවීම්		200,000.00	200,000.00
			765,516,000.00	**372,139,331**
	හානි පාඩු සඳහා වෙන්කිරීම්		(200,000.00)	(200,000.00)
			765,316,000.00	**371,939,331**

				2022	2021
8	**විකිණිය හැකි (AFS) මූල්‍යවත්කම්**				
	ලැයිස්තු ගත නොකල ආයෝජන	**(සටහන් 8.1)**		**1,200,010**	**1,200,010**
	8.1 ලැයිස්තු ගත නොකල ආයෝජන	කොටස් සංඛ්‍යාව			
	සීමාසහිත ලංකා එක්සත් පුවත්පත් සමාගම	20,000		200,000.00	200,000.00
	ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා පුද්ගලික සමාගම	100,000		1,000,000.00	1,000,000.00
	එල් ජී එල් පුද්ගලික සමාගම	1		10.00	10.00
				1,200,010.00	**1,200,010**

			2022	2021
9	**භාණ්ඩ තොග**			
	පාරිභෝගික භාණ්ඩ		3,223,796.31	2,905,391.07
	මැණික් - ගෙවුඩ මධ්‍යස්ථානය		183,547.54	183,547.54
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය තොග		2,220,237.29	1,003,636.00
			5,627,581.14	**4,092,575**

			2022	2021
10	**ලැබිය යුතු දෑ**			
	ලැබිය යුතු දෑ		164,085,403.16	85,984,392.83
	හානි පාඩු සඳහා වෙන්කිරීම		(1,407,972.00)	(1,407,972.00)
	පෙර ගෙවීම්		29,250,359.56	11,043,081.27
			191,927,790.72	**95,619,502.00**

			2022	2021
11	**කල් පිරෙන තෙක් වූ ආයෝජන (HTM)**			
	ක්‍රමක්ෂය පිරිවැය මත ධාරන වටිනාකම			
	භාණ්ඩාගාර බිල්පත්	ලංකා බැංකුව	**829,090,562.97**	**608,722,190**
		මහජන බැංකුව	**818,492,706.49**	**589,902,805**
			1,647,583,269.46	**1,198,624,995**

12	**තැන්පතු සහ අත්තිකාරම්**		
	පොදු තැන්පතු	175,998,861.39	178,455,221.39
	අනිකුත්	30,725.00	30,725.00
	ආරක්ෂිත තැන්පතු	61,500.00	61,500.00
		176,091,086.39	**178,547,446.39**
	හානි පාඩු සඳහා වෙන්කිරීම්	(1,433,947.00)	(1,433,947.00)
		174,657,139.39	**177,113,499**
13	**සේවක ණය සහ අත්තිකාරම්**		
	අත්තිකාරම්	77,562.68	191,315.01
	වැටුප් රහිත නිවාඩු	119,944.79	143,128.73
	වාහන ණය	4,574.34	4,574.34
	රෙදිපිළි ණය	64,000.24	58,000.24
	ආපදා ණය	17,628,717.92	14,679,985.05
		17,894,799.97	**15,077,003**
14	**අනිකුත් මූල්‍ය වත්කම්**		
	ස්ථාවර තැන්පත් - ලංකා බැංකුව	497,763,923.16	472,290,195.05
	මහජන බැංකුව	348,602,425.04	327,820,813.21
	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව (HDFC)	87,909,088.85	80,708,325.67
		934,275,437.05	**880,819,333.93**
15	**මුදල් සහ මුදල් සමාන දෑ**		
	මුදල් මාරු ශේෂයන්	1,587,333.33	1,344.082.40
	මුදල් හා බැංකු ශේෂයන් - ශ්‍රී. ලං. රු.	115,435,547.67	71,948,422.14
	බැංකු ශේෂය (විදේශ ව්‍යවහාර මුදල්)	5,811,019.74	11,615,905.50
		122,833,900.74	**84,908,410**

16. දායක ප්‍රාග්ධනය

රාජ්‍ය මැණික් සංස්ථාවට බැරවී ඇති සහ අධිකාරියට මාරුකළ ප්‍රමාණයෙන් සමන්විත මූලික ප්‍රාග්ධනයෙන් ප්‍රාග්ධනය නියෝජනය වේ.

17. මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල

මැණික් කර්මාන්තයේ නියුතු සේවකයන්ගේ ජීවිත අවධානම නිසා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අධිකාරිය විසින් 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 1 කොටසේ 14 (එන්) වගන්තියට අනුකූලව 2008 දක්වා සහ නැවත 2015 සිට මැණික් ගරන්නන්ගෙන් අරමුදල් එකතු කරන ලදි.

18. ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල

ස්වර්ණාභරණ කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනය වෙනුවෙන් 2007 අයවැය යෝජනා අනුව ස්වර්ණාභරණ නිෂ්පාදකයින්ගෙන් වාර්ෂික ලියාපදිංචි ගාස්තුව වූ රු.5,000/- බැගින් ඒකතු වූ මුදලින් මෙම අරමුදල සංයුක්තවේ .

19. මැණික් ත්‍යාග අරමුදල

1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ iv කොටසේ 52 වගන්තියේ අවශ්‍යතාවය අනුව අධිකාරිය වෙත ලැබෙන වැටලීම් වෙනුවෙන් අදාල පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු සහ දඩ මුදල් දඩ අරමුදල වෙත බැර කිරීමෙන් මෙම අරමුදල සමන්විතවේ. අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේඛ අංක 824 උපදෙස් අනුව වැටලීම් කණ්ඩායම්වලට සහ සේවකයන්ට ත්‍යාග පිරිනැමීම සඳහා මෙම අරමුදල නඩත්තු කෙරේ.

20. මැණික් ප්‍රත්‍යාගණන සංචිත

මැණික් ප්‍රදර්ශනවලට ඉදිරිපත් කරනු ලබන මැණික් ගල් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවන අතිරික්ත වලින් සමන්විත වේ.

21. ප්‍රත්‍යාගණන සංචිත

ඉඩම් , ගොඩනැගිලි හා වාහන ප්‍රත්‍යාගණනය කිරීම තුලින් ඇතිවන ප්‍රත්‍යාගණන අතිරික්තයන් ගෙන් ප්‍රත්‍යාගණන සංචිතය සමන්විත වන අතර ප්‍රත්‍යාගණනය කරන ලද එකිනෙක වත්කම් ඉවත් කිරීමේදී එම වත්කමට අදාල ප්‍රත්‍යාගණන අතිරික්ත වටිනාකම රඳවාගත් ඉපයුම්වලට මාරු කරනු ලැබේ.

22. විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්

		2022	2021
ජනවාරි 01 දිනට ශේෂය		**45,753,330.68**	**49,841,554.40**
විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනාගැනීම	සටහන් 22.1	**13,631.55**	**960,313.78**
2022 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම්		(9,428,191.50)	(5,048,537.50)
2022 වර්ෂයේ ගැළපීම්		-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය		**36,338,770.73**	**45,753,331**

22.1 විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනාගැනීම

	2022	2021
පොළී වියදම	5,444,646.35	4,834,630.80
වර්ෂය තුල අයකිරීම්	1,930,028.28	2,508,880.40
උපකල්පනයන්ගේ වෙනස්වීම් තුලින් පැන නගින (ලාභ)/අලාභ	**(7,361,043.08)**	**(6,383,197.42)**
	13,631.55	**960,314.78**

විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීමේදී අධිකාරියේ කළමනාකාරීත්වය වඩාත් උචිත විචල්‍ය ඇස්තමේන්තු පදනම් කරගෙන මෙම උපකල්පනයන් අධිකාරිය විසින් සංවර්ධනය කෙරේ.

භාවිතා කරනු ලබන මූලික උපකල්පනයන් පහත දැක්වේ.

වට්ටම් අනුපාත (%)	12	10
අනාගත වැටුප් වැඩිවීම් සාමාන්‍ය චේතන (%)	1.3	1.3
සේවක පිරිවැටුම් සාධකය (%)	2.5	2.5
විශ්‍රාම යන වයස (අවුරුදු)	60	60

වර්ෂයේ ආරම්භය ගණනය කිරීම සඳහා 12% ක වට්ටම් අනුපාතයක් ගන්නා ලදී. LKS 19 හි 84 ඡේදය මගින් නිර්දේශ කර ඇති පරිදි පවතින වත්මන් අර්බුදය හේතුවෙන් සුවිශේෂී ලෙස ඉහළ වෙළඳපල අනුපාතය ඉවත් කිරීමට එය යොදා ගෙන ඇත.

		2022	2021
23.	**කල්බදු ගෙවීම් සඳහා වූ වගකීම**		
	දළ වගකීම		
	ජනවාරි 01 දිනට	**296,825.00**	**336,313.00**
	වර්ෂය තුල හඳුනා ගැනීම්	**-**	**-**
	වර්ෂය තුල ගෙවීම්	(39,488.00)	(39,488.00)
	දෙසැම්බර් 31 දිනට	**257,337.00**	**296,825**
	මූල්‍ය පිරිවැය		
	ජනවාරි 01 දිනට	**292,417.00**	**331,125.00**
	වර්ෂය තුල හඳුනාගැනීම්	**-**	**-**
	වර්ෂයේ විස්තීරණ ආදායම තුල **මූල්‍ය** පිරිවැය හඳුනාගැනීම		(38,708.00)
	අනාගත කාලපරිච්ඡේදය සඳහා **මූල්‍ය** පිරිවැය	**292,417.00**	**292,417**
	දෙසැම්බර් 31 වන විට ශුද්ධ වගකීම	**35,080.00**	**(4,408)**
	23.1 වගකීම් වර්ගීකරණය		
	වර්ෂයක් තුල පියවිය යුතු		
	දළ වගකීම්	59,900.00	59,900.00
	අනාගත කාල පරිච්ඡේද සඳහා **මූල්‍ය** පිරිවැය	(58,232.00)	(58,232.00)
		1,668.00	**1,668**
	වර්ෂයක් ඉක්මවීමෙන් පසු පියවිය යුතු		
	පියවීම වර්ෂ දෙක සහ පහ අතර		
	දළවගකීම්	236,925.00	236,925.00
	අනාගත කාලපරිච්ඡේද සඳහා වෙන්කළ මූල්‍ය පිරිවැය	(236,925.00)	(234,183.00)
		-	**2,742**
	පියවීම වර්ෂ පහ ඉක්මවූ		
	දළ වගකීම්	3,410.75	-
	අනාගත කාල පරිච්ඡේද සඳහා වෙන්කළ **මූල්‍ය** පිරිවැය	-	-
		3,410.75	-
	වර්ෂයක් ඉක්මවා පියවිය යුතු වගකීම් එකතුව	**3,410.75**	**2,742**
	දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම් එකතුව	**5,078.75**	**4,410**
24.	ගෙවියයුතු දෑ		
	ණයහිමියෝ	187,039,135.64	188,791,845.82
	කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවාගත් මුදල්	22,611,037.52	13,608,477.56
	අනිකුත්	76,501,507.78	11,150,657.67
		286,151,680.94	**213,550,981**

		2022	2021
25.	**තැන්පතු සහ අත්තිකාරම් ලැබීම්**		
	සේවක ආරක්ෂිත තැන්පතු	111,500.00	61,500.00
	ගණුදෙණු කරුවන්ගේ අත්තිකාරම්	15,896.26	15,896.26
	සේවකයන්ගේ වැඩිපුර අයකර ගැනීම්	-	30,088.67
	ඉඩම් ආරවුල් තැන්පතු	116,136,877.40	101,209,759.14
	ටෙන්ඩර් තැන්පතු	9,713,580.00	9,567,680.00
	ලෝක වෙළඳ මධ්‍ය. වෙළඳ කුටි රඳවා ගැනීම්	6,035,980.68	4,555,138.70
	මැණික් කෞතුකාගාර අරමුදල	125,997.00	125,997.00
	අපනයන සේවා තැන්පතු	280,000.00	280,000.00
	වෛද්‍ය යෝජනා ක්‍රම අරමුදල	460,993.29	-
		132,880,824.63	**115,846,060**
26.	**ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ**		
	සංස්ථාපිත බදු (26.1)	92,558,964.60	35,861,818.73
	එකතුකල අගය මත බදු	1,546,626.73	6,184,401.78
	රඳවාගත් මැණික් වෙන්දේසි බදු 2.5%	525,030,110.66	347,017,042.23
	මුද්දර ගාස්තු	2,269,782.41	3,447,237.41
	සමාජ ආරක්ෂණ දායක බදු	596,631.04	-
		622,002,115.44	**392,510,500**
	26.1 සංස්ථාපිත බදු		
	ජනවාරි 01 දිනට ශේෂය	35,861,818.73	14,415,036.00
	වර්ෂය සඳහා වර්තන බදු	94,670,212.20	37,973,065.73
	වර්ෂයතුල ගෙවීම් - පසුගිය වසර බැඳීම් පියවීම	(32,588,746.00)	(10,480,089.00)
	- ස්ව තක්සේරු ගෙවීම්	(6,000,000.00)	(6,000,000.00)
	බදු බැර පියවීම් - ආර්ථික සේවා ගාස්තු	-	-
	- රඳවාගත් බදු	-	-
	- ජාතික බදු	-	-
	පසුගිය වර්ෂය සඳහා වූ අධි/(ඌණ) වෙන්කිරීම් මත ගැලපීම	615,679.67	(46,194.00)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**92,558,964.60**	**35,861,819**
27.	**වෙන්කිරීම් සහ උපචිත වියදම්**		
	උපචිත වියදම්	52,474,515.31	78,328,415.66
		52,474,515.31	**78,328,416**

28. ආදායම්	2022	2021
ඉඩම් වෙන්දේසි - රජයේ ඉඩම්	38,540,000.00	2,639,395.43
ඉඩම් වෙන්දේසි - ඉඩම් ප්‍රති.කොමි.සභාව	36,173,675.90	560,000.00
සේවා සහ බලපත්‍ර අභියාචන ගාස්තු	982,100.00	642,980.00
මැණික් ගැරීමේ බලපත්‍ර ගාස්තු	41,090,675.00	36,208,018.00
වෙළඳාම් බලපත්‍ර ගාස්තු	71,864,937.00	42,848,080.60
ත්‍යාග සහ සාම්පල් සඳහා සේවා ගාස්තු	192,000.00	360,000.00
මැණික් හා ස්වර්ණාභරණ අපනයන සේවා ගාස්තු	246,425,833.89	141,895,336.04
මැණික් කැපීමේ බලපත්‍ර ගාස්තු	392,135.00	411,346.00
ගෙවුඩ අපනයන සේවා ගාස්තු	5,940,738.84	6,315,111.32
LDO ඉඩම් සහ ඛණිජ බද්ද	5,480,000.00	4,436,750.00
සමථ ගාස්තු මගින් ආදායම්	15,804,209.48	10,648,707.66
මැණික් වෙන්දේසි බලපත්‍ර	1,470,500.00	946,000.00
මැණික් පරීක්ෂා කිරීමේ ගාස්තු	9,220,797.03	4,790,918.00
ස්වර්ණාභරණ පරීක්ෂාව හා තත්ත්ව මුද්‍රා ආදායම්	20,845,410.43	7,525,480.37
බලපත්‍ර පිටපත් ගාස්තු	68,570.00	43,290.32
කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු	15,872,968.31	8,448,400.00
මැණික් පාර්සල් නිශ්කාශණයෙන් ආදායම්	2,749,109.14	2,583,103.81
පාරිසරික ආරක්ෂණය	1,080,000.00	-
BACO සේවා ගාස්තු	40,036,400.00	39,345,000.00
පරීක්ෂණ ගාස්තු	45,391,200.00	40,511,800.00
වර්ණ කාඩ්පත් සඳහා ආදායම	5,577,400.00	3,091,800.00
ව්‍යාපෘති වලින් ලත් මැණික් වෙළඳාම	54,666,767.26	19,126,585.14
රාජසන්තක ඇප	7,714,500.00	8,980,350.00
ඉල්ලම් ප්‍රවාහන බලපත්‍ර ගාස්තු	1,682,600.00	607,340.00
මැණික් ප්‍රවාහන ගාස්තු ආදායම	9,500.00	498,168.77
ඉංජිනේරුවන්ගේ පරීක්ෂණ ගාස්තු	17,039,000.00	15,963,200.00
ව්‍යාපෘති ආදායම	-	125,475,200.00
වීසා ගාස්තු ආදායම	1,248,555.00	985,466.50
මැණික් පතල් කැපීම සඳහා යන්ත්‍රෝපකරණ ගාස්තු	1,423,050.00	-
	688,982,632.24	**525,887,828**

29. අනිකුත් ආදායම්		
විවිධ ආදායම්	1,400,670.14	583,765.32
ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සහ රත්නපුර වෙළඳසැල් -ආදායම	-	13,343,831.25
පොත් අලෙවිය	43,800.00	22,200.00
ලාභාංශ	600,000.00	-
කුලී ආදායම්	9,225,648.65	3,779,423.94
වෙන්දේසි අයිතම වලින් ලද මුදල්	-	2,576,208.00
රක්ෂණ නියෝජිතායතන වලින් ලද ආදායම්	861,754.95	713,719.68
අයකරගත් විදේශ ප්‍රදර්ශන වියදම	-	700,000.00
	12,131,873.74	**21,719,148**

30. පරිපාලන වියදම්	2022	2021
දායක මුදල්	1,148,347.64	1,278,565.91
සංග්‍රහ වියදම් - (දේශීය)	2,200,541.84	1,732,568.51
දුරකතන ගාස්තු	4,309,213.14	4,074,472.91
තැපැල් හා මුද්දර	1,762,413.06	931,945.16
අන්තර්ජාල ගාස්තු	4,581,090.74	4,511,366.45
අධ්‍යක්ෂ මණ්ඩල වියදම්	1,436,000.00	1,123,112.65
කුලී	59,022,197.70	23,374,414.31
විදුලිය	9,681,534.40	7,867,468.21
වරිපනම් සහ බදු	1,040,335.75	1,128,590.75
පුවත්පත් සහ වාර සඟරා	71,910.00	38,350.00
ජල ගාස්තු සහ බදු	1,156,062.79	959,417.92
ප්‍රචාරක	758,542.50	954,820.00
ප්‍රවාහන	760,094.76	1,126,836.33
රක්ෂණය	1,498,659.21	1,420,772.04
නීති වියදම්	2,774,244.00	2,683,906.50
වර්ෂය සඳහා විගණන ගාස්තු	1,200,000.00	1,049,260.00
මිනින්දෝරු ගාස්තු	437,528.44	-
කළමනාකාරීත්ව උපදේශක ගාස්තු	21,500.00	40,025.00
ගොඩනැගිලි නඩත්තු	18,857,687.62	12,549,804.12
උපකරණ නඩත්තු	7,152,537.50	2,613,873.69
ආරක්ෂක සේවා	15,530,200.00	19,862,720.00
වැඩමුළු සහ පුහුණු (දේශීය)	1,028,284.96	88,924.84
වැඩමුළු සහ පුහුණු (විදේශීය)	1,396,318.23	320,000.00
වැටලීම් වියදම්	313,790.00	223,610.00
සාමාන්‍ය වෙන්දේසි වියදම්	1,665,607.63	693,212.08
පරිත්‍යාග	-	200,000.00
පාරිභෝගික වත්කම්	204,573.36	24,567.00
කාර්යාල මිලදී ගැනීම්	9,277,535.72	4,309,442.61
භාවිත ඉඩම් අයිතියේ ක්‍රමක්ෂය	2,364.00	2,364.00
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	3,475,693.85	2,957,334.71
පරීක්ෂණාගාර සැපයුම්	1,553,963.55	174,837.20
පාරිසරික වියදම්	93,160.00	84,890.00
ක්ෂවීම්	49,003,686.17	34,431,460.46
ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කුලී	-	12,953,040.00
ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ විදුලිය බිල	-	559,240.08
රථ වාහන නඩත්තු	14,707,994.39	8,675,598.85
ඉන්ධන සහ තෙල්	14,533,242.24	8,835,003.24
ටයර් සහ ටියුබ්	1,990,488.80	1,339,256.56
රථ වාහන රක්ෂණ සහ බලපත්‍ර	642,811.08	439,823.62
රථ වාහන නැවතුම් ගාස්තු	330.00	-
පොදු වියදම්	382,893.00	427,634.73
ව්‍යාපෘති වියදම්	11,151,491.25	7,339,125.64
බැංකු ගාස්තු	2,120,472.56	828,776.34
මැණික් ගරන්නන්ගේ දරුවන් සඳහා වූ ශිෂ්‍යත්ව වියදම්	5,679,617.80	1,648,500.00
මැණික් ඉඩම් පුනරුත්ථාපනය	266,300.00	3,099,934.00
හානි / පාඩු ප්‍රතිපාදන	-	475,854.03
	254,891,259.68	**179,454,720**

		2022	2021
31.	**සේවක වියදම්**		
	වේතන සහ දීමනා	136,259,807.20	136,810,653.41
	වැඩ බැලීමේ දීමනා/අවදානම් දීමනා	491,411.89	429,433.00
	සේවක අර්ථ සාධක යටතට නොගැනෙන වේතන	18,613,001.98	5,237,666.36
	සේවක අර්ථ සාධක අරමුදල	22,161,386.43	22,327,024.31
	සේවක භාරකාර අරමුදල	4,434,106.54	4,465,404.98
	අතිකාල	4,767,494.17	6,639,611.17
	නිවාඩු දින වැඩකිරීම සඳහා ගෙවීම	76,942.87	48,009.50
	ඉතිරිකර කරගත් නිවාඩු දීමනා	10,741,676.58	12,480,231.75
	සේවක නිවාස ණය පොළී ගෙවීම්	222,229.56	185,459.80
	සේවක දිරි දීමනා	36,010,975.50	12,276,354.00
	පාරිතෝෂික ගෙවීම්	13,631.55	960,313.78
	ගමන් වියදම් (දේශීය)	1,806,707.21	1,468,483.00
	කාර්ය මණ්ඩල නිල ඇදුම්	743,500.00	443,450.00
	සේවක සුභ සාධක වියදම්	9,955,690.71	11,071,484.64
	කම්කරු වන්දි	7,743,886.00	-
	වෛද්‍ය ගාස්තු	13,770,793.23	13,887,746.23
	ප්‍රවාහන දීමනා	13,505,000.00	13,455,000.00
		281,318,241.42	**242,186,326**
32.	**ප්‍රවර්ධන වියදම්**		
	විදේශීය ගමන් වියදම්	121,800.00	476,710.00
	ප්‍රදර්ශන වියදම් (දේශීය)	204,168.60	-
	ප්‍රදර්ශන වියදම් (විදේශීය)	263,446.62	7,746,906.76
	ප්‍රචාරණය (දේශීය)	3,125,295.75	1,400,110.00
	ප්‍රචාරණය (විදේශීය)	706,720.00	-
	ප්‍රවර්ධන වියදම්	2,226,075.95	3,279,901.53
		6,647,506.92	**12,903,628**
33.	**ශුද්ධ මූල්‍ය ආදායම්**		
	පොළී ආදායම්		
	ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත් මත පොළී	266,997,815.60	128,458,355.97
	සේවක ණය පොළී	550,626.22	541,058.42
		267,548,441.82	**128,999,414**
	පොළී වියදම්		
	කල් බදු ගෙවීම් බැරකම් මත වූ මූල්‍ය පිරිවැය	(58,232.00)	(38,708.00)
		(58,232.00)	**(38,708)**
		267,490,209.82	**128,960,706**

		2022	2021
34.	**ආදායම් බදු වියදම**		
	වර්තමාන බදු වියදම් **(සටහන් 34.1)**	94,670,212.20	37,973,065.76
	පසුගිය වසර සඳහා (ඌණ)/ අධි වෙන්කිරීම් මත ගැළපීම්	615,680.00	(32,355.40)
	විලම්භිත ගැළපීම් **(සටහන් 6)**	2,229,210.00	(8,112,737.24)
		97,515,102.20	**29,827,973**

34.1 වර්තන බදු වියදම් සහ ගිණුම් ලාභ ඉපයීම් අතර සැසඳීම

ඒකාබද්ධ අරමුදලට දායක ගෙවීමෙන් පසු බදු ගෙවීමට පෙර ලාභය	**375,747,708**	**202,023,008**
ඉඩ නොදෙන අයිතමයන් එකතුව	109,547,112.00	81,847,206.00
ඉඩ දිය හැකි අයිතමයන් එකතුව	(40,235,602.00)	(50,978,748.00)
අනිකුත් ප්‍රභවයන්ගෙන් ආදායම්	(277,815,989.00)	(146,122,670.00)
වෙළඳ හෝ ව්‍යාපාරික කටයුතු වලින් ලාභ/(පාඩු)	**167,243,229**	**86,768,796**
බදු සඳහා අදාල අනිකුත් ආදායම් - පොළී ආදායම්	277,215,988.50	146,122,669.60
එකතු ව්‍යවස්ථාපිත ආදායම්	**444,459,217.50**	**232,891,465.60**
සුදුසුකම් ලබන ගෙවීම්	(50,000,000.00)	(40,000,000.00)
බදු පාඩු උපයෝජනය		(34,670,358.27)
තක්සේරුගත ආදායම් /බදු අයකල හැකි ආදායම්	**394,459,218**	**158,221,107**
ව්‍යවස්ථාපිත බදු අනුපාතය වූ 24% මත බදු ගාස්තු	94,670,212	37,973,066
බෙදිය හැකි ලාභ මත බදු	-	-
වර්ෂය සඳහා සාමාන්‍ය කටයුතු මත වර්තන බදු	**94,670,212**	**37,973,066**

35. ප්‍රාග්ධන සහ අනිකුත් බැදීම්

දෙමුවාවත ගොඩනැඟිල්ල සහ රත්නපුර ගොඩනැඟිල්ල ඉදිකිරීමට අදාළව අතුරු ගෙවීම් සඳහා ක්‍රියාකාරී ප්‍රගතිය මත වියදම්කර ඇති අතර වැඩ නිමකර සහතික කර ඇත. මිලියන 10.45ක පරිගණක මෘදුකාංග පැකේජයක් සංවර්ධනය කිරීමේ කාර්යයන් වලින් 60%ක් සම්පූර්ණ කර බවට සහතික කර ඇත.

36. වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසු ඇතිවන සිදුවීම්

ශේෂපත්‍ර දිනෙන් පසුව ප්‍රත්‍යාගණනය කරන ලද ප්‍රදර්ශන මැණික් ගල්වල ප්‍රත්‍යාගණන අගය රු. 765,316,000.00ක් ව ඇත.

37. අසම්භාව්‍ය බැරකම්

අධිකාරියෙහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු හේතුවෙන් පැන නගින නීතිමය හිමිකම් සම්බන්ධයෙන් අධිකාරියට අවිනිශ්චිත වගකීම් ඇත. විධිවිධානයක් ලෙස හඳුනා නොගන්නේ නම් (සටහන 27), කළමනාකාරීත්වය මෙම හිමිකම් අදාල නොවන ලෙස සලකන අතර ඒවා පියවීම සඳහා සම්පත් පිටතට ගලා යාමේ හැකියාව දුරස්ථ වේ. මෙම ඇගයීම අධිකාරියේ නීති අංශයේ නීති උපදෙස් සමග අනුකූල වේ.

38. සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම

අධිකාරියෙහි සම්බන්ධිත පාර්ශවයන් මහා භාණ්ඩාගාරය, රජයට සම්බන්ධිත ආයතන, රජයට අයත් ව්‍යාපාරික ආයතන සහ ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයින් ගෙන් සමන්විත වේ.

මැණික් හා ස්වර්ණාභරණ අපනයන ඔස්සේ එකතු කර ගන්නා ලද අරමුදල් සහ ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය සමඟ එකතුව ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සමාගම (Lanka Gemological Laboratory (pvt) Ltd) පිහිටුවා ඇති අතර 2014 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු. 126,512,567.00 ක් විය.

38.1 ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් හා සිදුවූ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 අනුව "සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම" ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් හට සෘජුවම හෝ වක්‍රව ආයතනයේ කටයුතු සැලසුම් කිරීම, මගපෙන්වීම්, පාලනය කිරීම් පිළිබඳ වගකීම පැවරී ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් ලෙස වර්ගීකරණය කෙරේ.

ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් සමග සිදුවූ ගනුදෙනු පහත දක්වා ඇත.

	2022	2021
පාරිශ්‍රමික සහ අනෙකුත් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ		
සේවා කාලයෙන් පසු ප්‍රතිලාභ		
පශ්චාත් රැකියා ප්‍රතිලාභ	-	-

38.2 සම්බන්ධිත පාර්ශවයන් හා ගනුදෙනු

අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශවයන් හා සිදුකරන ලද ගනුදෙනු පිළිබඳ වැදගත් තොරතුරු පහත දක්වා ඇත.

සම්බන්ධිත පාර්ශවය	වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය සඳහා කරන ලද ගනුදෙනුවල ස්වභාවය	ගනුදෙනුවේ වටිනාකම	ශේෂය (ගෙවිය යුතු) / ලැබිය යුතු
රජයට අයිති ව්‍යාපාරික ආයතන	ස්ථාවර තැන්පතුවල සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය	567,414,377.75	-
	ස්ථාවර සහතික සහ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගැනීම්	(65,000,000.00)	502,414,378.00
	ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO)	-	-
අනිකුත් රජය හා සම්බන්ධිත ආයතන	කොටස්වල ආයෝජනය	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IMT/G/NGJA/FA/2022 මෙහි අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 ජූනි 16 දින

සභාපති,
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තක්ත්වාගණනය කළ මතය

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව 2022 වර්ෂය තුලදී කෙරීගෙන යන වැඩ සඳහා මුදලින් ගෙවීම රු 113,559,640 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් ලෙස දැක්විය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. තවද, 2022 වර්ෂය තුලදී මුදලින් කරන ලද පාරිතෝෂික ගෙවීම් වටිනාකම රු.11,625,870 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස දැක්විය යුතු වුවද රු.1,995,790 ක් අඩුවෙන් රු.9,630,080 ක් පමණක් මුදල් ගලා යාමක් ලෙස සටහන් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 ප්‍රකාරව බදු ගණනය කල යුතු වුවද 2022 අංක 45 දරන දේශීය ආදායම් බදු පනතේ ඡේද අංක 33(3) අනුව මුල් මාස 06 සඳහා සියයට 24 හා දෙවන මාස 06 සඳහා සියයට 30 බදු අනුපාතය ලෙස සලකා බදු ගණනය කලයුතු බව දක්වා තිබුනද, මුළු කාලච්ඡේදය සඳහාම බදු අනුපාතය සියයට 24 යොදාගෙන ආදායම් බදු ගණනය කිරීම හේතුවෙන් බදු වියදම රු.11,833,776 කින් ඌන ගණනය වී තිබුණි.තවද, ඉහත පරිදි වෙනස් බදු අනුපාතයන් යොදා ගැනීම හේතුවෙන් විලම්භිත බදු වගකීම් රු.6,649,335ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි ඡේද 120 අනුව පාරිතෝෂික සම්බන්ධ සියලුම සේවා වියදම් ආකෘතිය අනුව විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කළ යුතු වුවද පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීමේදී වර්ෂයට අදාළ පාරිතෝෂික වියදම් වටිනාකම් වූ රු. 1,930,028 ක් හා පොලී වියදම් වූ රු. 5,444,646 ක් ඇතුලුව මුළු එකතුව රු. 7,374,674 ක් වියදම් ලෙස හා ආයුගණන ලාභය රු.7,361,043 ක් වෙනත් විස්තීරණ ආදායම් ලෙස සටහන් නොකර ශුද්ධ ප්‍රතිඵලය රු. 13,631 ක පාරිතෝෂික වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 37හි 10 ඡේදය ප්‍රකාරව අතීත ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි බැඳීමක් (Possible Obligation) සම්බන්ධයෙන් ගෙවීමට අපේක්ෂිත මුදල් අසම්භාව්‍ය බැරකමක් ලෙස ගිණුම්කරණ සටහන් යටතේ දැක්විය යුතු වුවද, එම තත්ත්වය ගිණුම් සටහන් මගින් හෙලිදරවු නොකර වන්දි වශයෙන් ගෙවීමට සිදුවෙයැයි අපේක්ෂිත මුදල් රු.7,700,000ක් පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ඉ) සුළු හා මධ්‍ය පරිමාණ මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන් නගා සිටුවීම් සඳහා අධිකාරිය විසින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් 02 ක් කුලියට ගෙන එහි කඩ කාමර පවත්වාගෙන යාමට ව්‍යාපාරිකයන් 19 දෙනෙකුට් කුලියට ලබාදී තිබුණි. ඉන් කඩ හිමියන් 03 දෙනකුගෙන් 2019 දක්වා ලැබිය යුතු රු.2,989,815 ක මුදල් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඊ) අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව වත්කම්වලට අදාල හානිකරණ අලාභ හඳුනාගැනීමේදී එම වත්කම් සමාලෝචනය කර ඊට අදාලව වෙන් කල යුතු හානිකරණ අලාභ වටිනාකම් වාර්ෂිකව

ඇස්තමේන්තු කල යුතු වුවත් එසේ සිදු නොකර අනෙකුත් වත්කම්, ලැබිය යුතු දෑ හා තැන්පතු සහ අත්තිකාරම් සඳහා පිළිවෙලින් රු.200,000, රු.1,407,972 හා රු.1,433,947 ක් ලෙස වූ එකම වටිනාකමක් වසර පහකට අධික කාලයක සිට නොවෙනස් වටිනාකමක් හානිකරණ අලාභ ලෙස ගිණුම්වලට ගැළපීම් කර තිබුණි.

(උ) අධිකාරිය සතු විදේශ මුදල් මඟින් ගණුදෙනු වන තැන්පතු 03 ක 2022 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය වූ ඇ.ඩො . 77,378.05 ක වටිනාකම එදිනට පැවති හුවමාරු වටිනාකමට (රු.362) අගය නොකිරීම හේතුවෙන් රු. 11,650,248 කින් මුදල් මුදල් හා සමාන දෑ හි වටිනාකම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) 2022 දෙසැම්බර් 31 දිනට වූ කොන්ත්‍රාත් රඳවා ගැනීම් ශේෂය රු.22,611,038 ක් වූ අතර එම ශේෂය තුල 2009 ජනවාරි 01 දිනට පෙර සිට පැවත එන රු.2,568,873 ක වටිනාකමක් ඇතුළත්ව තිබුණද, එම වටිනාකමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(එ) වතු සමාගමක් වෙනුවෙන් ගෙවිය යුතු රු.22,306,195 ක මුදල සඳහා අධිකාරිය විසින් රු.22,090,642 ක් උසාවියෙහි තැන්පත් කර ඇති අතර එම මුදල් පිළිවෙලින් විවිධ ණයහිමියන් යටතේ සහ විවිධ තැන්පතු යටතේ ගිණුම් ගත කර ඇති නමුත් ඒ සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඒ) බාහිර පාර්ශවයන් විසින් ඉඩම් ආරවුල් විසඳා ගන්නා තෙක් අධිකාරියේ තැන්පත් කර ඇති රු.116,136,877 ක මුදල් ලද තැන්පතු හා අත්තිකාරම් යටතේ ගිණුම් ගත කර ඇති නමුත් ඒ සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත්, නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබෙනම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ (ඇ), (ඉ) සහ (ඊ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික . තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 486	චෙක්පත් අගරු වූ විටකදී ඒ සඳහා වන වටිනාකම හැකි ඉක්මනින් මුදලින් අයකරවා ගත යුතු වුවත් වර්ෂ 09 ක් ඉක්මවූ අගරු චෙක්පත් 02 ක වටිනාකම වූ රු.178,840 සඳහා මුදල් අයකරගෙන නොතිබුණි.
(ආ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වන වගන්තිය	මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු. 26,890,229ක් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණි.
(ඇ) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ	ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත් පමණක් සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන/සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වෙත පැවරිය හැකි නමුත්, මැණික් ව්‍යාපෘති සිදු කිරීමට එම සමිති වෙත බලය පවරා නොතිබුණි. නමුත්, අධිකාරිය විසින් මැණික් ව්‍යාපෘති 4 ක කටයුතු සිදුකිරීමට සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන සමඟ ගිවිසුම්වලට එළඹ එම කටයුතු සිදුකිරීමට බලය පවරා තිබුණි.
(ඇ) 2021.11.16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව දින 60 ක් ඇතුලත වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් සමඟ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වුවත් ආයතනය විසින් වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන කවිටලය සමඟ ඉදිරිපත්කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍යයන්, කාර්යයන්	නිරීක්ෂණ
(අ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත	
(i) 14 (ග) වගන්තිය	මැණික් කර්මාන්තයේ හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වැඩ කරන තැනැත්තන්ගේ සේවා නියුක්ති නියමයන් හා කොන්දේසි, විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත හා ශරීරාංග අනතුරුවලින් ආරක්ෂා කිරීම සඳහා ගතයුතු ආරක්ෂක පියවර විධිමත් කිරීම හා

පාලනය කිරීමේ අරමුණින් මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කිරීමේදී අය කරනු ලබන මුදලින් රු.500 ක් මැණික් ගැරීමේ සුභසාධක අරමුදලට බැර කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට මෙම අරමුදලේ ශේෂය රු.34,807,024 ක් වූ අතර මෙම අරමුදල මගින් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

(ii) 15(1) වගන්තිය — වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුල මැණික් කර්මාන්තය කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව වගකිව යුතු එකම බලධාරියා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වන නිසා මැණික් කර්මාන්ත විෂයට අදාළ ප්‍රධාන නියාමන අධිකාරිය තුන්වන පාර්ශවය සමඟ සෘජුවම මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල නියැලීම පනතට පටහැනි බවට නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණත් සමාලෝචිත වර්ෂය තුල මැණික් ගැරීම් ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර තිබුණි.

(iii)15(2) වගන්තිය — මැණික් පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට හා නියාමනය කිරීමට ක්‍රමවේද සකස් කර නොතිබුණි.

(iv)17(1) වගන්තිය — කිසිම තැනැත්තකු විසින් කිසිම ස්ථානයක ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යාමේදී ඒ කර්මාන්තය කරගෙන යන ස්ථානය අධිකාරියේ ලියාපදිංචි විය යුතු වුවද, කර්මාන්ත කර ගෙන යන පුද්ගලයන් ලියාපදිංචි වී ඇත්ද යන්න පිළිබඳව නිසි නියාමනයක් සිදු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

03. වෙනත් කරුණු

(අ) අධිකාරිය විසින් රු.මිලියන.19ක පිරිවැයකට අධිකාරියේ භාවිතය සඳහා මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේදී මෘදුකාංග සැපයුම් ආයතනය සමඟ ගිවිසුම් ගත වී ඇති අතර ඒ සඳහා රු.10,621,000 ක් ගෙවා තිබුණි. මෙහි ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර වසර 06 කට අධික කාලයක් ගත වී ඇති නමුත් නිමකර නොතිබුණි.

(ආ) දේශීය අදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක SEC/2020/04 හි අනු අංක (C)2 පරිදි, යම් මාසයක එකතුකරන ලද රදවාගැනීමේ බදු ඊළඟ මස 15 දිනට පෙර දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂනය කල යුතු වුවද, 2022 නොවැම්බර් 30 දක්වා අධිකාරිය මැණික් හා ස්වර්ණාභරණ වෙන්දේසි කිරීමේදී අදාල වෙන්දේසි මුදලින් අයකරන ලද සියයට 2.5 ක රදවාගැනීමේ බදු රු.483,813,173 ක් 2022 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) කිලෝ ග්‍රෑම් 510ක් බර " Rough Sapphire Cluster" මැණික් පාෂාණය 2021 ඔක්තෝබර් 27 දින අයිතිකරු විසින් පිළියෙල කරන ලද ඉන්වොයිසියට අනුව ඇ.ඒ. ජනපද ඩොලර් 10,000,000 කට එනම් රු. 2,030,600,997 කට තක්සේරු කර තිබුණි. එය අධිකාරියේ අධ්‍යක්ෂ (තක්සේරු / රත්න විද්‍යාඥයකු විසින් මිලෙහි සාධාරණත්වයක් සහතික කර තිබූ අතර පාෂාණ තක්සේරුකර සහතික පත්‍රයක් ලබා ගැනීම සඳහා ස්විට්සර්ලන්තයේ ගැබ්ලින් රසායනාගාරය වෙත යවා තිබූ එම මැණික් පාෂාණය දින 443 කට පසුව මෙරටට ගෙන ඒමේදී 2020 මාර්තු 02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 13.6 ඡේදය ප්‍රකාරව අයකරගත යුතු ඉන්වොයිසියේ සම්පූර්ණ නැවගත වටිනාකමින් සියයට 1ක් වූ ඇ.ඒ.ජ. ඩොලර් 10,000,000 * 1% = 100,000 කට සමාන රු. 37,100,000 ක් (2023 ජනවාරි 13 දිනට ඇ.ඒ.ජ. ඩොලර් 1 = රු.371) බලපත්‍ර ලාභියාගෙන් අයකර ගෙන නොතිබුණි.

(ඈ) රත්නපුර මැණික් කෞතුකාගාරය ඉදිකිරීම සහ නාලන්දා උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 45 ක ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුලත් කර ඇති අතර, සමාලෝචිත වර්ෂය තුළ රු.250,000 ක් ගෙවා තත්ත්ව සහතික වාර්තාවක් පමණක් සකස් කර තිබුණද, ඉදිරි වැඩකටයුතු නතර කර තිබූ බැවින් එම වැය කල මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඉ) මැණික් බලපත්‍ර නිකුත් කිරීමේදී හාරනු ලබන මැණික් පතල් නැවත පුරවා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් සාමාන්‍ය පතලක රු.4500 සිට රු.9000 ක වටිනාකමක් සහ යාන්ත්‍රික පතල් සඳහා වර්ග අඩි 3000 සිට 4000 ක් දක්වා ප්‍රමාණයක් සඳහා රු.600,000 සිට රු.5,000,000 ක් ලෙස විශේෂ ආරක්ෂණ ඇපයක් පතල්කරුවන්ගෙන් අයකරන අතර එම පතල් නැවත ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසුව එම ඇප නැන්පතු නැවත ඔවුන් වෙත ලබාදීම සිදුකරයි. මේ ආකාරයට එකතුවූ රු.993,253,918 ක මුදලක් පතල් කැණීමකරුවන් විසින් නැවත ලබා ගැනීමකින් තොරව තිබූ අතර, එම හේතුවෙන් මෙම මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය වීමත් සිදුවී තිබෙද යන්න පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ඊ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සුළු හා මධ්‍ය පරිමාණ මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන්ට කඩ කාමර ලබාදීම සඳහා අධිකාරිය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථාන සමාගම අතර ඇති කර ගෙන තිබූ බදු කුලී ගිවිසුම 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කර තිබුණි.

ඒ අනුව අධිකාරිය විසින් 2004 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල ලබාදී තිබූ ආරක්ෂිත ඇප තැන්පතු රු.16,368,300 ක් විගණිත දිනය වන 2023 පෙබරවාරි 28 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආරම්භ කරන ලද මැණික් ත්‍යාග අරමුදල සඳහා අනවසර මැණික් ගැරීම් වලදි අධිකාරිය පනවන දඩ මුදල් සහ රාජසන්තක කරන භාණ්ඩ සහ ඉල්ලම් වෙන්දේසි කිරීමේදි ලැබෙන මුදල් සහ අධිකරණය විසින් නියම කරන දඩ මුදල් බැර කරනු ලබන අතර අධිකරණය විසින් පනවන ලද දඩ මුදල් හැර අනිකුත් එකතු කරන දඩ මුදල් වලින් සියයට 35 ක් වැටලීම් කරන කණ්ඩායමට හා සියයට 5 ක් වැටලීම් කරන කාර්යාලයට හා සියයට 10 අධිකාරියේ සියලුම සේවකයන්ට ලබාදී ඉතිරි සියයට 50 අධිකාරියේ ආදායමට බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට මෙම අරමුදලේ ශේෂය රු.45,226,589 ක් විය.

(ඈ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනත 1993 වර්ෂයේ අනුමත කර ගැනීමෙන් පසුව එය කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේද පියවර ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.ඒ.සී. වික්‍රමරත්න
විගණකාධිපති